Pew Research Center

2023 සැප්තැම්බර් 12 දින නිකුත් කිරීම සඳහා

# දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව

*තායිලන්තයේ, කාම්බෝජයේ සහ ශ්‍රී ලංකාවේ බෞද්ධයින් තම ආගම සහ රට අතර ශක්තිමත් බැඳීම් තිබෙන දකින අතර, මැලේසියාවේ සහ ඉන්දුනීසියාවේ මුස්ලිම්වරුන් ද එසේම වේ.*

සම්පාදනය *ජොනතන් එවන්ස්, කෙල්සි ජෝ ස්ටාර්, මනොලෝ කොරිචි සහ විලියම් මයිනර් විසිනි*

**මාධ්‍ය හෝ වෙනත් විමසීම් සඳහා:**

**ජොනතන් එවන්ස්**, ජ්‍යෙෂ්ඨ පර්යේෂක
**අක්සා කැලහන්**, සන්නිවේදන කළමනාකාර
**ගාර් මෙං ලියොං**, සන්නිවේදන කළමනාකාර

202.419.4372

www.pewresearch.org

**නිර්දේශිත උපුටා ගැනීම්**

Pew Research Center, 2023 සැප්තැම්බර්, "දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව"

# Pew Research Center ගැන බිදක්

Pew Research Center යනු ලෝකය හැඩ ගස්වන ගැටළු, ආකල්ප සහ ප්‍රවණතා පිළිබඳ මහජනතාව දැනුවත් කරන අපක්ෂපාතී, අනනුග්‍රාහී විශේෂඥ මණ්ඩලයකි. එය කිසිදු දේශපාලන මතයක් නියෝජනය නොකරයි. Pew Research Center මගින් ජන මත විමසුම්, ජනවිකාස පර්යේෂණ, සංඛ්‍යාත්මක සමාජ විද්‍යා පර්යේෂණ සහ අනෙකුත් දත්ත පාදක පර්යේෂණ සිදු කරයි. එය දේශපාලනය සහ ප්‍රතිපත්ති; පුවත් චර්යා සහ ජනමාධ්‍ය; අන්තර්ජාලය සහ තාක්ෂණය; ආගම; ජාතිය සහ වාර්ගිකත්වය; ජාත්‍යන්තර කටයුතු; සමාජ, ජනවිකාස සහ ආර්ථික ප්‍රවණතා; විද්‍යාව; පර්යේෂණ ක්‍රම විද්‍යාව සහ දත්ත විද්‍යාව; සහ ආගමන හා විගමන කටයුතු පිළිබඳ අධ්‍යයනයන් සිදු කරයි. Pew Research Center එහි මූලික අරමුදල් සැපයුම්කරු වන The Pew Charitable Trusts හි අනුබද්ධිතා යතනයකි.

© Pew Research Center 2023

# ස්තුතිය

Pew-Templeton Global Religious Futures ව්‍යාපෘතියේ කොටසක් ලෙස Pew Research Center විසින් සකසන ලද මෙම වාර්තාව මගින් ආගමික වෙනස්වීම් පිළිබඳවත් එමගින් ලොව පුරා ජන සමාජ මත ඇති කරන්නාවූ බලපෑමත් පිළිබඳවත් විශ්ලේෂණය කරයි. Global Religious Futures ව්‍යාපෘතියට අරමුදල් සපයනු ලබන්නේ The Pew Charitable Trusts සහ John Templeton Foundation (61640 ප්‍රතිපාදනය) මගිනි.

මෙම වාර්තාව පහත නම් සඳහන් පුද්ගලයින්ගේ යෙදවුම් සහ විශ්ලේෂණය පාදක කොටාගත් සහයෝගී ප්‍රයත්නයක ප්‍රතිඵලයකි. ආශ්‍රිත වාර්තා මාර්ගගතව බැලීමට [pewresearch.org/religion](pewresearch.org/religion) සබැඳිය වෙත යන්න.

## පර්යේෂණ කණ්ඩායම

ජොනතන් එවන්ස්, *ජ්‍යෙෂ්ඨ පර්යේෂක*
ඇලන් කූපර්මන්, *ආගමික පර්යේෂණ පිළිබඳ අධ්‍යක්ෂ*
කෙල්සි ජෝ ස්ටාර්, *පර්යේෂණ විශ්ලේෂක*
මනොලෝ කොරිච්, *පර්යේෂණ විශ්ලේෂක*
විලියම් මයිනර්, *පර්යේෂණ සහකාර*

## ක්‍රම කණ්ඩායම

පැට්‍රික් මොයිනිහාන්, *ජාත්‍යන්තර පර්යේෂණ ක්‍රම පිළිබඳ සහකාර අධ්‍යක්ෂ*
සොෆී සිනොසිච්, *ජාත්‍යන්තර සමීක්ෂණ විධික්‍රමශිල්පී*
ක්ලාක් ලෙටර්මන්, *ජ්‍යෙෂ්ඨ සමීක්ෂණ කළමනාකාර*

## කතුවැකි සහ ග්‍රැෆික් නිර්මාණය

මයිකල් ලිප්කා, *පුවත් සහ තොරතුරු පර්යේෂණ සහකාර අධ්‍යක්ෂ*
රෙබෙකා ලෙපර්ට්, *පිටපත් සංස්කාරක*
බිල් වෙබ්ස්ටර්, *ජ්‍යෙෂ්ඨ තොරතුරු ග්‍රැෆික් නිර්මාණකරු*

## සන්නිවේදනය සහ වෙබ් ප්‍රකාශනය

අක්සා කැලහන්, *සන්නිවේදන කළමනාකාර*
ගාර් මෙං ලියොං, *සන්නිවේදන කළමනාකාර*
රීම් නදීම්, *ඩිජිටල් නිෂ්පාදක*
ඇනා ශිලර්, *සන්නිවේදන සහකාර අධ්‍යක්ෂ*
ස්ටේසි රොසෙන්බර්ග්, *ඩිජිටල් උපායමාර්ග අධ්‍යක්ෂ*

මෙම වාර්තාව සැකසීමට දායක වූ Pew Research Center හි අනෙකුත් පුද්ගලයින් අතරට නේහා සාගල්, කොන්රැඩ් හැකට්, ඈන් ෆෙන්ජියන් ෂී, යුංපින් තොං, ලෝරා සිල්වර්, ජෙෆ් ඩයමන්ට්, ජැනෙල් ෆෙටරොෆ්, ග්‍රෙගරි ඒ. ස්මිත්, බෙෂීර් මොහොමඩ්, සමයිරා මජුන්දර්, හෙකා ඒ. ඇල්ෆර්, නීල් රුයිස් සහ ග්‍රේසි මාටිනස් යනාදීන් ඇතුළත් වේ.

මෙම වාර්තාව සැකසීමට දායකත්වය දුන් හිටපු Pew Research Center හි කාර්ය මණ්ඩලයට ඒරියානා මොනික් සැලසාර්, ඇඩම් වොල්ස්කි, ස්කොට් ගාඩ්නර්, ස්ටේසි පැන්ක්‍රැට්ස්, මාර්තා මැක්රෝයි, ඇලෙක්සැන්ඩ්‍රා කැස්ටිලෝ, ඕම්කාර් ජෝෂි, මාක් වැං, ඇබී බියුඩිමන්, කැට් ඩෙල්වින් සහ ජේම්ස් බෙල් යනාදීන් ඇතුළත් වේ.

මෙම වාර්තාවේ සෑම අදියරකදී ම මග පෙන්වීම් සිදු කළ පහත විශේෂඥ උපදේශක මණ්ඩලයට Pew Research Center හි කෘතඥතාව හිමි වේ. University of Vermont හි ආගම පිළිබඳ මහාචාර්ය තෝමස් බෝර්චර්ට්; Macalester College හි ආගමික අධ්‍යයන පිළිබඳ මහාචාර්ය එරික් ඩේවිස්; Cornell University හි ආසියානු අධ්‍යයන පිළිබඳ මහාචාර්ය කියාරා ෆෝමිචි; University of Gothenburg හි සමාජ විද්‍යා හා වැඩ විද්‍යා දෙපාර්තමේන්තුවට අනුබද්ධ සමාජ මානව විද්‍යාව පිළිබඳ පර්යේෂක ඇලෙක්සැන්ඩ්‍රා කෙන්ට්; Yale-NUS College හි මානව විද්‍යාව පිළිබඳ සහකාර මහාචාර්ය නීනා මහාදේව්; Duke University හි ආගමික අධ්‍යයනය සහ සමාජ විද්‍යාව පිළිබඳ සහකාර මහාචාර්ය ඇනා සන්; York University (ටොරොන්ටෝ) හි මානව ශාස්ත්‍ර සහ ආගමික අධ්‍යයනය පිළිබඳ සහකාර මහාචාර්ය ඇලිෂියා ටර්නර්, සහ ස්වාධීන ශාස්ත්‍රඥ එරික් වයිට්.

සමීක්ෂණයේ ක්ෂේත්‍ර කටයුතු Langer Research Associates හි මඟපෙන්වීම යටතේ සිදු කරන ලදී.

මෙම වාර්තාවෙහි විශ්ලේෂණ කටයුතු සිදු කරන ලද්දේ අප උපදෙස් ලබා ගත් උපදේශකයින්ගේ මඟපෙන්වීම යටතේ වන අතර, එහි දත්ත විවරණය සහ වාර්තාකරණය පිළිබඳ තනි වගකීම Pew Research Center සතු වේ.

# අපි මෙම වාර්තාව සැකසූ ආකාරය

මෙම වාර්තාව සැකසීම සඳහා අපි ආසියාවේ රටවල් හයක් පුරා වැඩිහිටියන් 13,122 දෙනෙකු ජාතික වශයෙන් නිරූපණය වන ක්‍රමවේද භාවිතයෙන් සමීක්ෂණය කළෙමු. මේ සඳහා වූ මුහුණට මුහුණ සම්මුඛ සාකච්ඡා කාම්බෝජය, ඉන්දුනීසියාව, ශ්‍රී ලංකාව සහ තායිලන්තය යන රටවල දී සිදු කරන ලදී. මැලේසියාව සහ සිංගප්පූරුව තුළ මෙම සම්මුඛ සාකච්ඡා ජංගම දුරකථන ඔස්සේ සිදු කරන ලදී. ප්‍රාදේශීය සම්මුඛ පරීක්ෂකයින් විසින් 2022 ජුනි සිට සැප්තැම්බර් දක්වා භාෂා අටකින් සමීක්ෂණය සිදු කරන ලදී.

ආගමික වෙනස්වීම් ගැනත් ලොව පුරා ජන සමාජ කෙරෙහි එහි බලපෑමත් අධ්‍යයනය කිරීම උදෙසා Pew Research Center හි පුළුල් ප්‍රයත්නයක් වන Pew-Templeton Global Religious Futures ව්‍යාපෘතියේ කොටසක් ලෙස මෙම සමීක්ෂණය සිදු කරන ලදී. Pew Research Center මීට පෙර උප සහරානු අප්‍රිකාව; මැද පෙරදිග-උතුරු අප්‍රිකානු කලාපය සහ විශාල මුස්ලිම් ජනගහනයක් සිටින රටවල්; ලතින් ඇමරිකාව; ඊශ්‍රායලය; මධ්‍යම සහ නැගෙනහිර යුරෝපය; බටහිර යුරෝපය; ඉන්දියාව; සහ එක්සත් ජනපදය තුළ ආගම් පාදක කොටගත් සමීක්ෂණ සිදු කර ඇත.

මෙම සමීක්ෂණයට බෞද්ධයන් බහුතරයක් සිටින රටවල් තුනක් (කාම්බෝජය, ශ්‍රී ලංකාව සහ තායිලන්තය); මුස්ලිම් බහුතරයක් සිටින රටවල් දෙකක් (මැලේසියාව සහ ඉන්දුනීසියාව); සහ තනි බහුතර ආගමික කණ්ඩායමක් නොමැති ආගමික විවිධත්වයකින් යුත් එක් රටක් (සිංගප්පූරුව) ඇතුළත් වේ. අපි ආසියාව තුළ අමතර රටවල් සහ භූමි ප්‍රදේශ පහක් ද සමීක්ෂණය කරමින් සිටින අතර එය ඉදිරියේ දී වාර්තාවකින් එළි දැක්වීමට නියමිතව ඇත.

සමීක්ෂණයට ප්‍රතිචාර දක්වන්නන්ට එහි ප්‍රශ්න පිළිබඳ අවබෝධය ඉහළ නැංවීමට සහ සියලුම ප්‍රශ්න සංස්කෘතිකව යෝග්‍ය බවට සහතික කිරීම සඳහා, Pew Research Center විසින් ආසියානු රටවල් කිහිපයක් පුරා සිටින ශාස්ත්‍රීය ප්‍රවීණයන්ගේ මෙන්ම ඉලක්කගත කණ්ඩායම්වල උපදේශන සහ ගැඹුරු සම්මුඛ සාකච්ඡා ඇතුළත් බහු අදියර ප්‍රශ්නාවලියක් වැඩි දියුණු කිරීමේ ක්‍රියාවලියක් අනුගමනය කරන ලදී. මීට අමතරව, ජාතික සමීක්ෂණය සිදු කිරීමට පෙර සෑම රටකම පූර්ව පරීක්ෂණයක් සිදු කරන ලදී. ප්‍රශ්නාවලිය ඉංග්‍රීසි බසින් සකස් කර භාෂා හතකට පරිවර්තනය කරන ලදී. ස්වදේශීය ප්‍රවීණතා සහිත වෘත්තීය භාෂාවේදීන් විසින් මෙම පරිවර්තනවල නිරවද්‍යතාව ස්වාධීනව පරීක්ෂා කරන ලදී.

සමීක්ෂණයට ප්‍රතිචාර දක්වන්නන් තෝරා ගන්නා ලද්දේ සම්භාවිතාව පදනම් කොටගත් නියැදි සැලසුමක් භාවිතයෙනි. තායිලන්තයේ මුස්ලිම් ජාතිකයින් විශාල කොටසක් වෙසෙන දකුණු කලාපය තුළ සිදු කරන ලද අතිරේක සම්මුඛ සාකච්ඡා ද මෙයට ඇතුළත් තර ඇත. ප්‍රතිචාර දක්වන්නන් අතර තෝරාගැනීමේ විවිධ සම්භාවිතාවන් විවරණය වන පරිදි සහ එක් එක් රටේ වැඩිහිටි ජනගහනය සඳහා වන ජනවිකාස මිණුම් ලකුණු සමග සැසඳෙන පරිදි දත්ත ශෝධනය කර ඇත.

වැඩි විස්තර සඳහා, වාර්තාවේ ක්‍රමවේදය කොටස (ඉංග්‍රීසි බසින්) වෙත යොමු වන්න. මෙම විශ්ලේෂණය මෙම සමීක්ෂණ ප්‍රශ්නාවලිය මත පදනම් වේ.

# අපි මෙම අධ්‍යයනයෙහි ඇතුළත් රටවල් තෝරා ගත් ආකාරය

මීට පෙර Pew Research Center විසින් ආගම පිළිබඳ ලොව වටා සිදු කළ සමීක්ෂණවලින් අවධානය යොමු කර ඇත්තේ සුවිශද භූගෝලීය කලාප, තනි රටවල් හෝ විශේෂ ආගමික කණ්ඩායම් පිළිබඳව යි. බෞද්ධ බහුතරයක් සිටින රටවල් තුනක්, මුස්ලිම් බහුතරයක් සිටින රටවල් දෙකක් සහ ආගම් මිශ්‍රණයක් සහිත එක් රටක් වශයෙන් මෙම සමීක්ෂණයට යොදාගත් හයක් වූ රටවල් සමූහය ස්වභාවිකත්වයෙන් අඩු කාණ්ඩකරණයක් ලෙස පෙනෙන්නට පුළුවන. රටවල් භූගෝලීය වශයෙන් එකිනෙකට තරමක් සමීපව පිහිටා ඇති නමුදු රටවල් හයම *අග්නිදිග* ආසියාවට අයත් නොවන අතර (ශ්‍රී ලංකාව සාමාන්‍යයෙන් කාණ්ඩගත කරන්නේ දකුණු ආසියාව සමග යි) තවත් අග්නිදිග ආසියානු රටවල් කිහිපයක් මෙම අධ්‍යයනයට ඇතුළත් නොවේ.

කෙසේ නමුත් සමීක්ෂණයේ ප්‍රධාන ඉලක්කය වන්නේ අග්නිදිග ආසියාව තුළ ආගම, සහ විශේෂයෙන් බුදුදහම පිළිබඳ ගවේෂණය කිරීම යි. මෙම සමීක්ෂණයට ලෝකයේ බෞද්ධ බහුතරයක් ජීවත්වන ජාතීන් හතෙන් තුනක් - එනම් කාම්බෝජය, ශ්‍රී ලංකාව සහ තායිලන්තය ඇතුළත් වේ. මෙම රටවල බෞද්ධයින් ප්‍රධාන වශයෙන් ථේරවාද සම්ප්‍රදාය අනුගමනය කරන අතර, එය සමහර අග්නිදිග ආසියානු රටවල් සමග දිගු කලක් තිස්සේ පවතින සංස්කෘතික හා ආගමික සබඳතා තිබීම ශ්‍රී ලංකාව මෙම සමීක්ෂණයට ඇතුළත් කිරීමට ප්‍රධාන හේතුවකි.

ලාඕසය සහ මියන්මාරය (බුරුමය ලෙස ද හැඳින්වේ) ද ථේරවාදී සම්ප්‍රදාය අනුගමනය කරන අග්නිදිග ආසියාතික, බෞද්ධ බහුතරයක් සිටින රටවල් වන නමුත් එම රටවල දේශපාලනික යථා ස්වභාවයන් සහ ආරක්ෂක කරුණු හේතුවෙන් මෙම අවස්ථාවේ සංවේදී මාතෘකා පිළිබඳව විශ්වාසී, ස්වාධීන සමීක්ෂණ පැවැත්වීමට ඉඩහසර නොලැබිණි.




# මෙම සමීක්ෂණයට ඇතුළත් රටවල්

"දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව"

**PEW RESEARCH CENTER**

අග්නිදිග ආසියාව තුළ ආගම සහ ජාතික අනන්‍යතාවයේ ඡේදනය පිළිබඳ සංසන්දනාත්මක යථාදර්ශනයන් ලබා දීම සඳහා මෙම සමීක්ෂණයට ඉන්දුනීසියාව සහ මැලේසියාව යන මුස්ලිම් බහුතරයක් සිටින රටවල් මෙන්ම ආගමික විවිධත්වයෙන් හෙබි රටක් වන සිංගප්පූරුව ද ඇතුළත් වේ.

# දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව

*තායිලන්තයේ, කාම්බෝජයේ සහ ශ්‍රී ලංකාවේ බෞද්ධයින් තම ආගම සහ රට අතර ශක්තිමත් බැඳීම් තිබෙන දකින අතර, මැලේසියාවේ සහ ඉන්දුනීසියාවේ මුස්ලිම්වරුන් ද එසේම වේ.*

එක්සත් ජනපදයේ සහ අනෙකුත් බටහිර රටවල බුද්ධාගම හා සම්බන්ධ සමහර පිළිවෙත් සහ චින්තනයන් වඩාත් සුලභ වී ඇති බැවින් බොහෝ එක්සත් ජනපද ඇමරිකානුවන් බුද්ධාගම මනා සිහිය පැවැත්වීම හෝ භාවනාව සම්බන්ධ ආගමක් බවට සිතන්නට පුළුවන. කෙසේ නමුත් ලෝකයේ අනෙකුත් ප්‍රදේශවල **බුද්ධාගම යනු හුදෙක් මනස සහ කය හා සම්බන්ධ දර්ශනයක් පමණක් නොවන අතර, එය ජාතික අනන්‍යතාවයේ ප්‍රධාන අංගයක් වේ.**

## බෞද්ධ බහුතරයක් වෙසෙන රටවල ආගම සහ ජාතික අනන්‍යතාව එකිනෙකට බැඳී ඇත

*සැබෑම ____ (උදා. සැබෑ කාම්බෝජ ජාතිකයෙකු) වීමට නම් බෞද්ධයෙකු වීම වැදගත් බව පවසන*




*බෞද්ධයින්ගේ %*

මූලාශ්‍රය: සමීක්ෂණය 2022 ජූනි මස 1 සිට සැප්තැම්බර් 4 දක්වා දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් හයක වැඩිහිටියන් අතර සිදු කරන ලදී. විස්තර සඳහා ක්‍රමවේදය කියවන්න.
"දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව"

PEW RESEARCH CENTER

Pew Research Center විසින් 2022 දී දකුණු සහ අග්නිදිග ආසියාවේ රටවල් හයක් අනුසාරයෙන් සිදුකළ සමීක්ෂණයක් අනුව, රටෙහි වැඩිහිටියන්ගෙන් 70%ක් අවම වශයෙන් බෞද්ධයන් වන කාම්බෝජය, ශ්‍රී ලංකාව සහ තායිලන්තය යන රටවල වෙසෙන බෞද්ධයන් දහයෙන් නවයකට වැඩි පිරිසක් පවසන්නේ **බෞද්ධයෙකු වීම සැබවින්ම තම ජාතියේ කොටස්කරුවකු වීමට වැදගත් වන බව** යි.


නිදසුනක් ලෙස, ශ්‍රී ලාංකික බෞද්ධයින්ගෙන් 95%ක් සැබෑ ශ්‍රී ලාංකිකයෙකු වීමට නම් බෞද්ධයෙකු වීම වැදගත් බවත්, ඉන් 87%ක් සැබෑ ශ්‍රී ලාංකිකයෙකු වීමට බුදුදහම *ඉතා* වැදගත් බවත් පවසති.

මෙම රටවල බොහෝ දෙනා ආගමික වශයෙන් තමා බෞද්ධයන් ලෙස හැඳින්වුව ද, **බුද්ධාගම යනු ආගමකින් ඔබ්බට ගිය දෙයක් බවට වූ පුළුල් කතිකාවතක් පවතී.**[1] කාම්බෝජයේ, ශ්‍රී ලංකාවේ සහ තායිලන්තයේ බෞද්ධයන්ගෙන් අති බහුතරයක් බුද්ධාගම "තමන් අනුගමනය කිරීමට තෝරා ගන්නා ආගමක්" ලෙස විස්තර කරන් අතර, එපමණක් නොව, බුද්ධාගම "තමන් කොටස්කරුවකු වන සංස්කෘතියක්" සහ "තමන් අනුගමනය කළ යුතු පවුල් සම්ප්‍රදායක්" ලෙස ද හඳුන්වති.

මෙම රටවල බොහෝ බෞද්ධයන් බුද්ධාගම දකින්නේ "යමෙකුට උපතින්ම හිමිවන ජනවාර්ගිකත්වයක්" ලෙස වන අතර, ඊට නිදසුනක් ලෙස කාම්බෝජ බෞද්ධයන්ගෙන් 76% ක් මෙම මතය දරති.

## බොහෝ තායිලන්ත බෞද්ධයන් බුද්ධාගම දකින්නේ වාර්ගිකත්වයක් ලෙස යි

*රට අනුව බුදුදහම ____ ලෙස විස්තර කළ හැකි බව පවසන **බෞද්ධයින්** ගේ%*




මූලාශ්‍රය: සමීක්ෂණය 2022 ජූනි මස 1 සිට සැප්තැම්බර් 4 දක්වා දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් හයක වැඩිහිටියන් අතර සිදු කරන ලදී. විස්තර සඳහා ක්‍රමවේදය කියවන්න.
"දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව"

**PEW RESEARCH CENTER**

[1] කාම්බෝජය, ශ්‍රී ලංකාව සහ තායිලන්තය ලෝකයේ බෞද්ධ බහුතරයක් සිටින රටවල් හතෙන් තුනකි.

## බෞද්ධ බහුතරයෙන් සිටින රටවල බුද්ධාගම සහ ජාතික නීතිය

**රටවල් තුනේම නීති පද්ධතියෙන් බුද්ධාගමට ලබා දෙන ප්‍රමුඛතාව** තුළින්, ජාතික අනන්‍යතාව කෙරෙහි බුද්ධාගමේ වැදගත්කම පිළිබිඹු කරයි. කාම්බෝජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ, බුද්ධාගම ජාතික ආගම වන අතර රාජ්‍යය විසින් බෞද්ධ පාසල්වලට සහාය දැක්විය යුතු වේ. ශ්‍රී ලංකාවේ වත්මන් ව්‍යවස්ථාව මගින් බුද්ධාගමෙහි "ප්‍රමුඛස්ථානය" තහවුරු කරන අතර, එය "සුරැකීම සහ පෝෂණය කිරීම" පිළිබඳ වගකීම රජය සතු වේ. එමෙන්ම පසුගිය ශතවර්ෂය පුරා තායිලන්ත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අනුක්‍රමය මගින් බුද්ධාගමෙහි නිල ප්‍රමුඛතාව ඉහළ නංවා ඇති අතර, රටෙහි වඩාත්ම මෑත කාලීන ව්‍යවස්ථාවට අනුව රජය සතුව "බුද්ධාගමට සිදුවන ඕනෑම ආකාරයේ අනතුරක්/පීඩාවක් වළක්වා ගැනීමට අදාළ ක්‍රියාමාර්ග සහ යාන්ත්‍රණයන්" තිබිය යුතු වේ.

### කාම්බෝජ බෞද්ධයෝ තම රටෙහි නීතිය බෞද්ධ ධර්මය මත පදනම්ව සකස් කිරීමට අතිමහත් කැමැත්තක් දක්වයි

*තම රටේ නීතිය බෞද්ධ ධර්මය මත පදනම් කර ගැනීමට කැමති **බෞද්ධයින්ගේ** %*




මූලාශ්‍රය: සමීක්ෂණය 2022 ජූනි මස 1 සිට සැප්තැම්බර් 4 දක්වා දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් හයක වැඩිහිටියන් අතර සිදු කරන ලදී. විස්තර සඳහා ක්‍රමවේදය කියවන්න.
"දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව"

PEW RESEARCH CENTER

සමීක්ෂණයට අනුව, **රටවල් තුනේම බොහෝ බෞද්ධයන් තම ජාතික නීති පද්ධතිය** බුදුන් වහන්සේගේ ඉගැන්වීම් මූලික කොටගත් දැනුම, සිද්ධාන්ත සහ පිළිවෙත් අන්තර්ගත පුළුල් පරාසයක පැතිරුණු සංකල්පයක් වන **බෞද්ධ ධර්මය මත පදනම්ව සැකසීමට** කැමැත්තක් දක්වති. මෙම දෘෂ්ටිය කාම්බෝජ බෞද්ධයන් අතර බොහෝ දුරට ඒකමතික වන අතර (96%), ශ්‍රී ලංකාවේ (80%) සහ තායිලන්තයේ (56%) බෞද්ධ ඉගැන්වීම් සහ පිළිවෙත් මත ජාතික නීති පද්ධතිය පදනම් කර ගැනීමට සහාය දක්වන බෞද්ධයින්ගේ බහුතරය ඊට අඩු ය.


## දේශපාලනය තුළ ආගමික නායකයින්ගේ භූමිකාව

ජන සමාජයෙන් ආගමික නායකයින්ගේ භූමිකාව පිළිබඳ විමසූ විට, **ආගම සහ රජය අතර පවතින බැඳියාවට වැඩි කැමැත්තක් දක්වන්නන් ලෙස කාම්බෝජ බෞද්ධයන් නැවතත් කැපී පෙනේ.** නිදසුනක් ලෙස, කාම්බෝජ බෞද්ධයින්ගෙන් 81% ක් පවසන්නේ ආගමික නායකයින් දේශපාලන මැතිවරණවල දී ඡන්දය ලබා දිය යුතු බව වන අතර, ශ්‍රී ලංකාව (66%) සහ තායිලන්තය (54%) තුළ එම මතය දරන්නේ කුඩා බෞද්ධ බහුතරයකි. (තායිලන්ත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් බෞද්ධ භික්ෂූන් වහන්සේලාට, සාමනේරයන් වහන්සේලාට, යෝගීන්ට සහ පූජකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීම තහනම් කරයි.)

නමුත් බෞද්ධ ධර්මය මත පදනම්ව නීති පද්ධතිය සැකසීම සඳහා තම ඒකමතික සහයෝගය දක්වන කාම්බෝජයේ පවා, ආගමික නායකයින් දේශපාලන විරෝධතාවලට සහභාගී වීම (50%), තමා සහය දක්වන දේශපාලනඥයන් පිළිබඳ ප්‍රසිද්ධියේ කතා කිරීම (47%), තමාම දේශපාලඥයෙකු බවට පත් වීම (45%) යනාදියට කැමැත්තක් දක්වන්නේ බෞද්ධයන්ගෙන් අඩකට ආසන්න පිරිසකි.

## කාම්බෝජ බෞද්ධයන් ආගමික නායකයින් දේශපාලනයේ නියැලීම සම්බන්ධයෙන් සාපේක්ෂව ඉහළ මට්ටමේ සහයෝගයක් පළ කරයි

*රට අනුව ආගමික නායකයන්____ කළ යුතු බව පවසන* ***බෞද්ධයින්ගේ*** *%*




මූලාශ්‍රය: සමීක්ෂණය 2022 ජුනි මස 1 සිට සැප්තැම්බර් 4 දක්වා දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් හයක වැඩිහිටියන් අතර සිදු කරන ලදී. විස්තර සඳහා ක්‍රමවේදය කියවන්න.
"දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව"


PEW RESEARCH CENTER

## ඉන්දුනීසියාව සහ මැලේසියාව තුළ ඉස්ලාමයේ කාර්යභාරය

මෙම රටවල ජාතික අනන්‍යතාව කෙරෙහි බුදුදහමෙහි පවතින සම්බන්ධය අසල්වැසි මුස්ලිම් බහුතරයක් සහිත රටවල් වන ඉන්දුනීසියාවේ සහ මැලේසියාවේ ඉස්ලාමයේ භූමිකාවට යම් ආකාරවලින් සමගාමී වේ. **මෙම රටවල් දෙකේම සිටින සෑම මුස්ලිම්වරයෙක්ම පාහේ පවසන්නේ මුස්ලිම්වරයෙකු වීම සැබෑම ඉන්දුනීසියානුවකු හෝ මැලේසියානුවකු වීමට වැදගත් බව යි.** රටවල් දෙකෙහිම මුස්ලිම්වරු පොදුවේ ඉස්ලාමය විස්තර කරන්නේ හුදෙක්ම "යමෙකු විසින් අනුගමනය කිරීමට තෝරා ගන්නා ආගමක්" පමණක් නොව, සංස්කෘතියක්, පවුල් සම්ප්‍රදායක් හෝ ජනවාර්ගිකත්වයක් ලෙස යි. නිදසුනක් ලෙස, මැලේසියානු මුස්ලිම්වරුන්ගෙන් හතරෙන් තුනක් පවසන්නේ ඉස්ලාමය යනු "යමෙකු උපතින්ම හිමිකම් කියන ජනවාර්ගිකත්වයක්" බව යි.

## බොහෝ ඉන්දුනීසියානු සහ මැලේසියානු මුස්ලිම්වරු ඉස්ලාමය විස්තර කරන්නේ ආගමකට වඩා වැඩි යමක් ලෙස යි

*රට අනුව ඉස්ලාමය____ ලෙස විස්තර කළ හැකි බව පවසන **මුස්ලිම්වරුන්ගේ** %*




මූලාශ්‍රය: සමීක්ෂණය 2022 ජූනි මස 1 සිට සැප්තැම්බර් 4 දක්වා දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් හයක වැඩිහිටියන් අතර සිදු කරන ලදී. විස්තර සඳහා ක්‍රමවේදය කියවන්න.
"දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව"

PEW RESEARCH CENTER

20 වන ශතවර්ෂයේ යටත් විජිත පාලනයෙන් මිදුණු දා පටන් මෙම රටවල් දෙක රාජ්‍ය පාලනය තුළ ආගමේ භූමිකාව වෙනුවෙන් එකිනෙකට වෙනස් මාර්ග අනුගමනය කර ඇති නමුත්, රටවල් දෙකෙහිම බොහෝ මුස්ලිම්වරු ෂරියා නීතිය රටේ නිල නීතිය බවට පත් කිරීමට කැමැත්තක් දක්වති. ඉස්ලාම් ධර්මය නිල ආගම වන මැලේසියාවේ මුස්ලිම්වරු ජාතික නීතිය ලෙස ෂරියා නීතිය භාවිතා කිරීමට අතිමහත් සහයෝගයක් දක්වයි (86%). එසේම බොහෝ මැලේසියානු මුස්ලිම්වරු දශකයකට පෙරාතුව ඉස්ලාමීය නීතිය රටේ නිල නීතිය බවට පත් කිරීමට කැමැත්ත පළ කළ අතර, ඒ බව විශාල මුස්ලිම් ජනගහනයක් සහිත රටවල් සම්බන්ධයෙන් 2011-2012 වසරවල Pew Research Center විසින් සිදුකළ සමීක්ෂණයෙහි (ඉංග්‍රීසි බසින් ලබාගත හැක) සඳහන් වේ.[2]

ඉන්දුනීසියාවේ මුස්ලිම්වරුන් අතර ෂරියා නීතිය සඳහා වන සහයෝගය තරමක් අඩු අතර, එහි දී 1945 ව්‍යවස්ථාවෙහි කෙටුම්පත්කරුවන් අවසානයේ පැහැදිලිවම ඉස්ලාමයට අනුග්‍රහය දක්වනන්නට ඉඩ තිබූ යෝජිත භාෂිතය ප්‍රතික්ෂේප කළ නමුත් රාජ්‍යය “එකම එක දෙවියකු පිළිබඳ විශ්වාසය මත පදනම් වන්නේ ය” ලෙස වූ භාෂිතය ඇතුළත් කළෝය. එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන බිඳවැටීම සමහර අවස්ථාවල දී වර්ගීකරණය කරනු ලබන්නේ "රාජ්‍යය සහ ආගම අතර සාපේක්ෂ (නිරපේක්ෂ නොවන) වෙන්වීමක්" සහිත "මෘදු ලෞකිකවාදය" ලෙස යි. කෙසේ නමුත් වර්තමානයේ ඉන්දුනීසියානු මුස්ලිම්වරුන්ගෙන් 64% ක් පවසන්නේ රටේ නීතිය


[2] 2022 මැලේසියානු සමීක්ෂණය දුරකථනය ඔස්සේ සිදු කරනු ලැබූ අතර, 2011-2012 මැලේසියානු සමීක්ෂණය මුහුණට මුහුණ ලා සිදු කරන ලදී.

ලෙස ෂරියා නීතිය භාවිතා කළ යුතු බව යි. මේ පිළිබඳ 2011-2012 කාලයේ දී විමසූ විට රටේ මුස්ලිම්වරුන්ගෙන් බහුතරයක් ඉස්ලාමීය නීතිය නිල ජාතික නීතිය බවට පත් කිරීමට සහයෝගය පළ කළහ.

**ඉන්දුනීසියාව සහ මැලේසියාව යන දෙරටේම මුස්ලිම්වරුන් දේශපාලනය තුළ ආගමික නායකයින් ඉහළ තනතුරු හෙබවීමට අනුග්‍රහය දක්වන ස්වභාවය අසල්වැසි රටවල සමීක්ෂණයට ලක් වූ බෞද්ධයින්ට වඩා ඉහළ අගයක් ගනී.** නිදසුනක් ලෙස, ඉන්දුනීසියාවේ (58%) සහ මැලේසියාවේ (69%) බොහෝ මුස්ලිම්වරුන් පවසන්නේ ආගමික නායකයින් තමා සහය දක්වන දේශපාලනඥයන් සහ දේශපාලන පක්ෂ ගැන ප්‍රසිද්ධියේ කතා කළ යුතු බව වන අතර, දේශපාලනය තුළ මෙවන් මට්ටමක ආගමික මැදිහත්වීමක් සඳහා සහය දක්වන්නේ කාම්බෝජයේ, ශ්‍රී ලංකාවේ සහ තායිලන්තයේ බෞද්ධයන්ගෙන් අඩක් හෝ ඊට අඩු ප්‍රමාණයකි.

## බොහෝ මැලේසියානු මුස්ලිම්වරුන් පවසන්නේ ආගමික නායකයින් දේශපාලනඥයන් විය යුතු මෙන්ම තම දේශපාලනය ගැන කතා කළ යුතු බව යි.

*රට අනුව ආගමික නායකයන්____ කළ යුතු බව පවසන **මුස්ලිම්වරුන්ගේ** %*




මූලාශ්‍රය: සමීක්ෂණය 2022 ජූනි මස 1 සිට සැප්තැම්බර් 4 දක්වා දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් හයක වැඩිහිටියන් අතර සිදු කරන ලදී. විස්තර සඳහා ක්‍රමවේදය කියවන්න.
"දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව"

PEW RESEARCH CENTER


## වෙනත් ආගම් කෙරෙහි දක්වන ආකල්ප

බෞද්ධ බහුතරයක් වෙසෙන මෙම රටවල් තුන සහ මුස්ලිම් බහුතරයක් වෙසෙන මෙම රටවල් දෙක සමග ආගමික බහුතරයක් නොමැති, සමහර මිනුම්වලට අනුව[ලොව වඩාත්ම ආගමික විවිධත්වයක් සහිත ජන සමාජය] ලෙස සලකනු ලබන සිංගප්පූරුව ද මෙම සමීක්ෂණයට ඇතුළත් කර ඇත. [වඩාත් මෑතක දී සිදු කළ සංගණනයට] අනුව, සිංගප්පූරු වැඩිහිටියන්ගෙන් 31%ක් බෞද්ධයන් ලෙසත්, 20%ක් ආගමික අනුබද්ධතාවක් නොමැති අය ලෙසත් (එනම් ඔවුන් පවසන්නේ ඔවුන්ට ආගමක් නොමැති බව යි), 19% ක් ක්‍රිස්තියානි ලෙසත්, සහ 15% මුස්ලිම් ලෙසත් හඳුනාගෙන ඇත. ජනගහනයේ ඉතිරි 15% ට හින්දු, සීක්, ටාඕවාදීන් සහ චීන සාම්ප්‍රදායික ආගම් අනුගමනය කරන පුද්ගලයින් ඇතුළත් වේ. (සිංගප්පූරුවේ ආගමික සංයුතිය සහ එය කාලයත් සමග වෙනස් වී ඇති ආකාරය පිළිබඳ වැඩි විස්තර සඳහා, ["සිංගප්පූරුවේ වෙනස් වෙමින් පවතින ආගමික අනන්‍යතාව"]) කියවන්න.

බොහෝ සිංගප්පූරු වැසියන් (56%) පවසන්නේ විවිධ ආගම්, ජනවාර්ගික කණ්ඩායම් සහ සංස්කෘතිවලට අයත් මිනිසුන් සිටීම තම රට ජීවත්වීමට වඩා හොඳ තැනක් බවට පත් කරන බවත්, ස්වල්ප දෙනෙක් (4%) පවසන්නේ එය තම රට ජීවත්වීමට වඩා නරක තැනක් බවට පත් කරන බව යි. (37% ක් වූ ඉතිරි ප්‍රතිචාර දක්වන්නන් පිරිස පවසන්නේ එම විවිධත්වයෙන් එතරම්

### තම රටේ විවිධත්වය පිළිබඳ කුඩා පිරිසක් දරන්නේ සෘණාත්මක මතයකි

*විවිධ ආගම්, ජනවාර්ගික කණ්ඩායම් සහ සංස්කෘතිවලට අයත් මිනිසුන් සිටීම තම රට____ බවට පත් කරන බව පවසන ජන %*




සටහන: වෙනත්/දෙකම/කිසිවක් නොවේ/රඳා පවතී/දන්නේ නැත/ප්‍රතික්ෂේප කළේය යන ප්‍රතිචාර නොපෙන්වයි.
මූලාශ්‍රය: සමීක්ෂණය 2022 ජුනි මස 1 සිට සැප්තැම්බර් 4 දක්වා දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් හයක වැඩිහිටියන් අතර සිදු කරන ලදී. විස්තර සඳහා ක්‍රමවේදය කියවන්න.
"දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව"

PEW RESEARCH CENTER

වෙනසක් නොවන බව යි.) එමෙන්ම අන්‍යාගම් ඉවසීම පිළිබඳ මිනුම් කිහිපයක් සම්බන්ධයෙන්

සිංගප්පූරු වැසියන් දරන්නේ වෙනත් කණ්ඩායම් කෙරෙහි පුළුල් ලෙස පිළිගන්නා මතයකි. නිදසුනක් ලෙස, සිංගප්පූරුවේ වැඩිහිටියන් අතරින් දහයෙන් නවයක් පමණ පවසන්නේ ක්‍රිස්තියානි, ඉස්ලාම්, හින්දු සහ චීන සම්ප්‍රදායික ආගම් සියල්ල සිංගප්පූරුවේ සංස්කෘතියට සහ සාරධර්මවලට අනුකූල බව යි.[3]

සිංගප්පූරුව සමහර අවස්ථාවල දී එහි වැසියන්ගේ ප්‍රකාශනය පිළිබඳව දක්වන්නාවූ ඉහළ ඉවසීමේ මට්ටම් සම්බන්ධයෙන් කැපී පෙනෙන අතර, සිංගප්පූරුවේ වැඩිහිටියන්ට වඩා (56%) මැලේසියාවේ සහ ශ්‍රී ලංකාවේ වැඩිහිටියන් (රටවල් දෙකේම 62%) ආගමික, වාර්ගික සහ සංස්කෘතික විවිධත්වය තම රටට ප්‍රතිලාභ ලබා දෙන බව පැවසීමට ඇති ඉඩකඩ ඉහළ ය. **පොදුවේ ගත් විට අනෙකුත් ආගම් පිළිබඳ ඉවසීම මෙම රටවල් හයේම පුළුල් ලෙස පිළිගන්නා කරුණකි.** සියලුම ප්‍රධාන ආගමික කණ්ඩායම් පුරා බොහෝ අය පවසන්නේ විවිධ ආගමික ප්‍රජාවන්ට අයත් සාමාජිකයන් තම අසල්වැසියන් ලෙස පිළිගැනීමට තමන් කැමති බව යි. නිදසුනක් ලෙස, ශ්‍රී ලාංකික බෞද්ධයන්ගෙන් 81% ක් හින්දු වැසියන් සමග අසල්වැසියන් ලෙස ජීවත් වීමට කැමති බව පවසන අතර, ශ්‍රී ලාංකික හින්දු ජනයාගේ ද ඊට සමාන කොටසක් (85%) බෞද්ධයන් සම්බන්ධයෙන් එම අදහස ම දරති.

එමෙන්ම සමස්තයක් ලෙස, සමීක්ෂණය කරන ලද බොහෝ රටවල ජනයා වෙනත් ආගම් තම ජාතික සංස්කෘතිය හා සාරධර්ම සමග අනුකූල බවට දැකීමට නැඹුරුතාවක් දක්වති. මුස්ලිම් බහුතරයක් වෙසෙන මැලේසියාවේ 67%ක් පවසන්නේ බුද්ධාගම මැලේසියානු සංස්කෘතිය හා සාරධර්ම සමග ගැළපෙන බව යි. සමීක්ෂණයට දශකයකට මදක් වැඩි කාලයකට පෙර සිවිල් යුද්ධයක් තිබී අවසන් වූ ශ්‍රී ලංකාවේ පවා රටෙහි බෞද්ධයින් (බහුතර ප්‍රජාව) 60%ක් ඇතුළුව, ජනගහනයෙන් 68% ක් පවසන්නේ ක්‍රිස්තියානි ධර්මය සහ හින්දු ආගම ශ්‍රී ලංකා සංස්කෘතිය හා සාරධර්ම සමඟ ගැළපෙන බව යි.

[3] Pew Research Center හට සිංගප්පූරුව තුළ නිදහසේ සමීක්ෂණය සිදු කිරීමට හැකි වූ නමුත්, සිංගප්පූරුව තුළ ප්‍රකාශනයේ නිදහස හා මාධ්‍ය නිදහස සීමා කර ඇති බව මෙම වාර්තාව පුරා පාඨකයන් මතක තබා ගත යුතු ය. විද්වතුන් සඳහන් කොට ඇත්තේ සිංගප්පූරුවේ මිනිසුන් "ආණ්ඩුව තම මතවලට එකඟ නොවන බව සිතෙන විට ඔවුන් බොහෝ විට තම අදහස් ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින" බව යි. සිංගප්පූරු රජය ආගමික සංහිඳියාව පවත්වා ගැනීම කෙරෙහි විශාල අවධානයක් යොමු කර ඇති අතර මෙම නැඹුරුව හේතුවෙන් අනෙකුත් ආගමික ප්‍රජාවන් පිළිබඳ ප්‍රශ්න මතු කිරීමේ දී බලපෑම් ඇති තිබිය හැක. කෙසේ නමුත්, පර්යේෂණ මගින් හඟවන්නේ රජයට යම් කාරණාවක් සම්බන්ධයෙන් පැහැදිලි ස්ථාවරයක් නොමැති විට දී සිංගප්පූරු වැසියන් තම අදහස් ප්‍රකාශ ඉරීමට වාඩාත් නැඹුරුවක් දක්වන බව යි.

## සිංගප්පූරු වැසියන් විවිධ ආගම් තම සමාජයට ගැළපෙන බව සැලකීමට ඉහළම නැඹුරුතාවක් දක්වති

*රට අනුව, තම රටේ සංස්කෘතිය සහ සාරධර්ම සමග ____ අනුකූල වනබව පවසන්නන්ගේ %,*

| | බුද්ධාගම | ඉස්ලාම් ධර්මය | ක්‍රිස්තියානි ධර්මය | හින්දු ආගම | චීන සාම්ප්‍රදායික ආගම් | දේශීය විශ්වාසයන්/ස්වදේශීය ආගම් |
|---|---|---|---|---|---|---|
| කාම්බෝජය | -- | 43% | 44% | 29% | 64% | 78% |
| ඉන්දුනීසියාව | 58% | -- | 60 | 60 | 48 | 56 |
| මැලේසියාව | 67 | -- | 65 | 65 | 67 | 67 |
| සිංගප්පූරුව | -- | 88 | 89 | 87 | 89 | 85 |
| ශ්‍රී ලංකාව | -- | 50 | 68 | 68 | -- | -- |
| තායිලන්තය | -- | 67 | 73 | 58 | 70 | 84 |

සටහන: තද පාටින් ඉහළ අගයන් නියෝජනය වේ. "බුද්ධාගම" පිළිබඳ විමසන ලද්දේ ඇසුවේ ඉන්දුනීසියාව සහ මැලේසියාව තුළ පමණි. "ඉස්ලාම් ධර්මය" පිළිබඳ විමසන ලද්දේ කාම්බෝජය, සිංගප්පූරුව, ශ්‍රී ලංකාව සහ තායිලන්තය තුළ පමණි. "චීන සාම්ප්‍රදායික ආගම්" සහ "දේශීය විශ්වාසයන්/ස්වදේශීය ආගම්" පිළිබඳ ශ්‍රී ලංකාව තුළ නොවිමසන ලදී.
මූලාශ්‍රය: සමීක්ෂණය 2022 ජූනි මස 1 සිට සැප්තැම්බර් 4 දක්වා දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් හයක වැඩිහිටියන් අතර සිදු කරන ලදී. විස්තර සඳහා ක්‍රමවේදය කියවන්න.
"දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව"

**PEW RESEARCH CENTER**

ආගමික කණ්ඩායම් බොහෝ දුරට එකිනෙකා අසල්වාසීන් සහ සෙසු පුරවැසියන් ලෙස පිළිගන්නා බව පමණක් නොව, බොහෝ අවස්ථාවල දී, ආගමික කොටස් අතර හවුල් ආගමික විශ්වාස සහ පිළිවෙත් ඇති බවට සලකුණු ද ඇත. නිදසුනක් ලෙස, සමීක්ෂණය කරන ලද සියලුම ආගමික කණ්ඩායම් තුළ කර්මය පිළිබඳ විශ්වාසයෙහි සම්බන්ධයක් නොමැති නමුත්, රටවල් හයේම සෑම විශාල ආගමික ප්‍රජාවකම පාහේ සැලකිය යුතු බහුතරයක් කර්මය (මිනිසුන් මෙම ජීවිතයේ දී තමා කරන යහපත් ක්‍රියාවලින් යහපත් ප්‍රතිලාභත්, අයහපත් ක්‍රියාවලින් අයහපත් ප්‍රතිවිපාකත් බොහෝවිට මරණයෙන් පසු ආත්මවල දී අත්විඳින බවට වන අදහස) පවතින බව පවසන ලදී. [4]

මීට අමතරව, බොහෝ අය තම ආගමේ දේව මණ්ඩලයේ කොටසක් ලෙස සාම්ප්‍රදායිකව සලකනු නොලබන දෙවිවරුන්ට හෝ ශාස්තෘවරුන්ට යාඥා කිරීම හෝ ගරු බුහුමන් දැක්වීම සිදු කරති. නිදසුනක් ලෙස, සිංගප්පූරු හින්දු භක්තිකයන්ගෙන් 66% ක් තමා යේසුස් ක්‍රිස්තුස් වහන්සේට යාඥා හෝ ගරු බුහුමන් සිදු කරන බවත්, ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන්ගෙන් 62%ක් එලෙසම ගණ දෙවියන්ට ගෞරව දක්වන බව පවසති.

බොහෝ විට ඔබේ සිරස නැමීම හෝ ඔබේ දෑත් එක් කිරීම වැනි අභිනයන් හරහා සිදු කරනු ලබන දෙවිවරුන්ට "ගරු බුහුමන් දැක්වීම", සාමාන්‍යයෙන් මෙම කලාපය තුළ දෙවිවරුන්ට නමස්කාර කිරීමේ හෝ වන්දනා කිරීමේ පිළිවෙතක් ලෙස හඳුන්වන අතර එයට සුවඳ දුම් පත්තු කිරීම, දානය පූජා කිරීම හෝ දෙවියන්ට ප්‍රාර්ථනා කිරීම වැනි විවිධ පිළිවෙත් ඇතුළත් විය හැක. මේවා යාච්ඤාව හෝ නමස්කාරය පිළිබඳ විධිමත්, බටහිර සංජානනය සමග නොගැලපෙන නමුත් මහත් ගෞරවය හෝ භක්තිය දක්වන අභිනයන් වේ. [5] (මිනිසුන් යාච්ඤා කරන හෝ තම ගෞරවය පුද කරන චරිත පිළිබඳ වැඩි විස්තර සඳහා "වෙනත් ආගම්වල චරිතවලට යාඥා කිරීම හෝ ගෞරව දැක්වීම" කියවන්න.)

### චීන සම්ප්‍රදායික ආගම් සහ ස්වදේශීය ආගම් යනු මොනවා ද?

"චීන සම්ප්‍රදායික ආගම්" කාණ්ඩය නම්‍යශීලී වන නමුත් ඉතා වැදගත් එකකි. අග්නිදිග ආසියාතික රටවල් කිහිපයක චීන ජනවාර්ගික පසුබිම් සහිත බොහෝ අය තමන් අතර වන පැහැදිලි වෙන්කිරීමක් පෙන්නුම් කිරීමකින් තොරව කොන්ෆියුෂියානු, මහායාන බෞද්ධ සහ ටාඕවාදී දෙවිවරුන් සඳහා වෙන් වූ විහාරස්ථානවල සාම්ප්‍රදායික චාරිත්‍රමය ක්‍රියාකාරකම්වල යෙදේ.

වෙනත් ආකාරයකට කිවහොත් කොන්ෆියුෂියානු, බෞද්ධ සහ ටාඕවාදී ආගමික සම්ප්‍රදායන් එකිනෙකට පැහැදිලිවම වෙනස් වුව ද ඒවා අතර පවතින සීමාවන් ප්‍රායෝගිකව ලිහිල් මට්ටමක පවතී. තව ද මෙම ආගමික පිළිවෙත් අනුගමනය කරන පුද්ගලයින් නිශ්චිත ආගමික අනන්‍යතාවකට හිමිකම් පෑමක් සිදු නොකිරීමට ඉඩ ඇත.

දේශීය විශ්වාසයන් සහ ස්වදේශීය ආගම් යන්නෙන් අදහස් වන්නේ කිසියම් ජන පිරිසක්, ජනවර්ගයක් හෝ ගෝත්‍රයක් සමග සමීපව සම්බන්ධව පවතින ආගම් වේ. එවැනි ආගමික සම්ප්‍රදායන් ගෝලීය පැවැත්මක් ඇති අනෙකුත් ආගම්වලට වඩා ස්ථාපිත බවින් අඩු වීමට ඉඩ ඇති අතර ස්වදේශීය ආගම් සහ අනෙකුත් ආගම් අතර පවතින සීමාවන් නොපැහැදිලි විය හැක.

---

[4] ආගම් තුළ කර්මයේ මූලාරම්භය විද්වතුන් විසින් විවාදයට බඳුන් කරන නමුත් මෙම සංකල්පය හින්දු ආගම, බුද්ධාගම, සීක් සහ ජෛන ආගම තුළ ගැඹුරට කිඳා බැස තිබේ.

[5] ආත්මයන්ට සහ දෙවිවරුන්ට ගෞරව දැක්වීම පිළිබඳ වැඩි විස්තර සඳහා, මෙම තායිලන්ත සිද්ධි අධ්‍යයනය කියවන්න.

## ආගමික කණ්ඩායම් අතර ඇති පැහැදිලි බෙදීම් සහ ආතතීන්

අන්‍යාගම් ඉවසීම සහ ආගමික මිශ්‍ර වීම පිළිබඳ මෙම ප්‍රකාශන මෙසේ තිබිය දී, ලෝකයේ මෙම කොටසේ ආගමික කණ්ඩායම් අතර ආගමික අනන්‍යතාව දැඩි බවක් ගත හැක.

ඇත්තෙන්ම **සමීක්ෂණය කරන ලද රටවල් පුරා සිටින බොහෝ පුද්ගලයින් පවසන්නේ මිනිසුන් තම ආගම අත්හැරීම හෝ වෙනත් ඇදහිල්ලකට යොමු වීම අනුමත කළ නොහැකි දෙයක් බව යි.** ඉන්දුනීසියාවේ මුස්ලිම්වරුන්ගෙන් 92% ක් පුද්ගලයෙකු ඉස්ලාම් ආගම හැර යාම අනුමත කළ නොහැකි බව පවසන අතර, කිතුනුවන්ගෙන් 83% ක් පවසන්නේ ක්‍රිස්තියානි ධර්මය අත්හැර වෙනත් ආගමකට යාම අනුමත කළ නොහැකි බව යි.

### අන් ආගමිකයන්ට වඩා මුස්ලිම්වරුන් පවසන්නේ තම ආගමෙන් වෙනත් ආගමකට මාරුවීම පිළිගත නොහැකි බව යි

*එක් එක් රටවල ආගමික කණ්ඩායම් අතර ප්‍රතිචාර දක්වන්නන් යම් පුද්ගලයෙකු ආගම අත්හැර වෙනත් ආගමක් වෙත යාම පිළිගත නොහැකි දෙයක් බව පවසන්නන්ගේ %*

| | බෞද්ධයෝ | මුස්ලිම්වරු | කිතුනුවන් | හින්දු භක්තිකයන් |
|---|---|---|---|---|
| කාම්බෝජය | 82% | -- | -- | -- |
| ඉන්දුනීසියාව | -- | 92% | 83% | -- |
| මැලේසියාව | 51 | 98 | 61 | 68% |
| සිංගප්පූරුව | 36 | 84 | 42 | 57 |
| ශ්‍රී ලංකාව | 74 | 64 | 67 | 74 |
| තායිලන්තය | 69 | 93 | -- | -- |

සටහන: නිදසුනක් ලෙස, කාම්බෝජ බෞද්ධයන්ගෙන් 82% ක් පවසන්නේ යම් පුද්ගලයෙකු බුදුදහම අත්හැර වෙනත් ආගමකට යාම අනුමත කළ නොහැකි බව යි. "--" මගින් පෙන්නුම් කරන්නේ විශ්ලේෂණය සිදු කිරීම සඳහා නියැදියේ විශාලත්වය ප්‍රමාණවත් නොවන බව යි. තද පාටින් ඉහළ අගයන් නියෝජනය වේ.
මූලාශ්‍රය: සමීක්ෂණය 2022 ජුනි මස 1 සිට සැප්තැම්බර් 4 දක්වා දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් හයක වැඩිහිටියන් අතර සිදු කරන ලදී. විස්තර සඳහා ක්‍රමවේදය කියවන්න.
"දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව"

**PEW RESEARCH CENTER**


සමස්තයක් වශයෙන් ගත් විට අනෙකුත් ආගමික ප්‍රජාවන්ට වඩා මුස්ලිම්වරුන් තම ආගමෙන් වෙනත් ආගමකට මාරුවීම අනුමත කළ නොහැකි බව පැවසීමට වැඩි නැඹුරුවක් දක්වති. නමුත් අධ්‍යයනයේ බෞද්ධ බහුතරයක් සිටින ජාතීන් තුන වන කාම්බෝජයේ, ශ්‍රී ලංකාවේ සහ තායිලන්තයේ බෞද්ධයන්ගෙන් තුනෙන් දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් දරන්නේ ද මෙම මතය යි.

සමීක්ෂණයට ලක් කළ රටවල් හයෙන් පහක සෑම වැඩිහිටියෙක්ම පාහේ වර්තමානයේ අදහනු ලබන්නේ ඔවුන් හැදී වැඩුණු ආගම යි. සිංගප්පූරුවේ පමණක් වැඩිහිටියන්ගෙන් සැලකිය යුතු කොටසක් (35%) ඔවුන්ගේ ජීවිත කාලය තුළ තම ආගම වෙනස් වී ඇති බව දක්වයි. (සිංගප්පූරුව තුළ ආගම මාරු කිරීම පිළිබඳ අමතර තොරතුරු සඳහා, "ක්‍රිස්තියානි හෝ ආගමික අනුබද්ධතාවක් නොමැති බවට හඳුන්වන සිංගප්පූරු වැසියන් ප්‍රමාණය ඉහළ යමින් පවතී" කියවන්න.)

එපමණක් නොව, රටවල් කිහිපයක සැලකිය යුතු පිරිසක් අනෙකුත් ආගම් තම ජාතික සංස්කෘතිය සහ සාරධර්ම සමග *නොගැලපෙන* ලෙස දකිති. නිදසුනක් ලෙස, ශ්‍රී ලාංකික බෞද්ධයන්ගෙන් 45% ක් ඉස්ලාම් ධර්මය ශ්‍රී ලාංකීය සාරධර්මවලට නොගැලපෙන බව පවසන අතර ඉන්දුනීසියානු මුස්ලිම්වරුන්ගෙන් 38% ක් පවසන්නේ බුද්ධාගම ඉන්දුනීසියානු සංස්කෘතියට නොගැලපෙන බව යි.

## බොහෝ රටවල ළමා කාලයේ ඇදහූ ආගම සහ වත්මන් ආගම අතර ඉහළ අනුරූපතාවක් පවතී

*තමා හැදී වැඩුණු ආගම සහ වර්තමානයේ අදහන ආගම එකම බව පවසන්නන්ගේ %*




මූලාශ්‍රය: සමීක්ෂණය 2022 ජූනි මස 1 සිට සැප්තැම්බර් 4 දක්වා දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් හයක වැඩිහිටියන් අතර සිදු කරන ලදී. විස්තර සඳහා ක්‍රමවේදය කියවන්න.
"දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව"

PEW RESEARCH CENTER

සමහර රටවල, බුද්ධාගම සාමකාමී *නොවන* බව පවසන මුස්ලිම් කොටස් ද, අනෙක් අතට ඉස්ලාමය සාමකාමී *නොවන* බව පවසන බෞද්ධ කොටස් ද සැලකිය යුතු ප්‍රමාණයක් සිටිති. මැලේසියානු මුස්ලිම්වරු (42%) විශේෂයෙන් බුද්ධාගම සාමකාමී නොවන බව ද, තායිලන්ත බෞද්ධයන් 36%ක් ඉස්ලාම් ධර්මය සාමකාමී නොවන බව ද පැවසීමේ නැඹුරුවක් පවතී.

සමහර රටවල සැලකිය යුතු ආගමික කොටස් ක්‍රිස්තියානි ධර්මය සහ හින්දු ආගම පිළිබඳ සෘණාත්මක හැඟීම් පළ කරයි. නිදසුනක් ලෙස, ඉන්දුනීසියාවේ සමීක්ෂණයට ලක් වූ මුස්ලිම් වැඩිහිටියන්ගෙන් 21% ක් පවසන්නේ ක්‍රිස්තියානි ධර්මය සාමකාමී නොවන බව යි.

අග්නිදිග සහ දකුණු ආසියාවේ රටවල් හයක වැඩිහිටියන් 13,122ක් යොදා ගනිමින් සිදු කරන ලද Pew Research Center සමීක්ෂණයේ ප්‍රධාන සොයාගැනීම් මේවා ය. කාම්බෝජය, ඉන්දුනීසියාව, ශ්‍රී ලංකාව සහ තායිලන්තය යන රටවල මුහුණට මුහුණ ලා සම්මුඛ සාකච්ඡා සිදු කරන ලද අතර මැලේසියාව සහ සිංගප්පූරුව තුළ ජංගම දුරකථන ඔස්සේ සම්මුඛ සාකච්ඡා සිදු කරන ලදී. ප්‍රාදේශීය සම්මුඛ පරීක්ෂකයින් විසින් 2022 ජූනි සිට සැප්තැම්බර්

දක්වා භාෂා අටකින් සමීක්ෂණය සිදු කරන ලදී. (වැඩිදුර විස්තර සඳහා වාර්තාවේ ඉංග්‍රීසි බසින් ඇති ක්‍රමවේදය කියවන්න.)

The Pew Charitable Trusts සහ John Templeton Foundation හි අරමුදල් යටතේ සිදුවන මෙම අධ්‍යයනය, ආගමික වෙනස් වීම් ගැනත් එමගින් ලොව පුරා ජන සමාජ කෙරෙහි එහි බලපෑම ගැනත් අවබෝධ කර ගැනීම සඳහා Pew Research Center විසින් දරන්නාවූ සුවිසල් ප්‍රයත්නයක කොටසකි. Pew Research Center මීට පෙර උප සහරානු අප්‍රිකාව; මැද පෙරදිග-උතුරු අප්‍රිකානු කලාපය සහ විශාල මුස්ලිම් ජනගහනයක් සිටින රටවල්; ලතින් ඇමරිකාව; ඊශ්‍රායිලය; මධ්‍යම සහ නැගෙනහිර යුරෝපය; බටහිර යුරෝපය; ඉන්දියාව; සහ එක්සත් ජනපදය තුළ ආගම් පාදක කොටගත් සමීක්ෂණ සිදු කර ඇත.

## මෙම දළ විශ්ලේෂණයේ ඉතිරි කොටස මගින් විවිධ මාතෘකා වඩාත් විස්තරාත්මකව ආවරණය කෙරෙන අතර, ඒවා නම්:

- ආගමික ප්‍රජාවන් සහ රටවල් පුරා ඇති විවිධ ආගමික විශ්වාසයන් සහ පිළිවෙත්
- මිනිසුන් යාඥා කරන හෝ ගරු බුහුමන් දක්වන දෙවිවරුන්
- අවමංගල්‍ය පිළිවෙත්
- වයස අනුව ආගමික භක්තිභාවයේ විවිධ මට්ටම්
- සිංගප්පූරුවේ ආගම පිළිබඳ - විශේෂයෙන්ම එහි වෙනස්වන ආගමික සංයුතිය සහ ආගමික අනුබද්ධතාවක් නොමැති ජනයාගේ විශ්වාසයන් පිළිබඳ ගවේෂණයක්
- ආගම සහ ජාතික අනන්‍යතාව මුහු වන ආකාරය පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක්


## අතිශය ආගමික කලාපයක් පුරා පැතිරුණු අනන්‍ය ඇදහිලි රටා

පොදුවේ ගත් විට අනුබද්ධතාව, විශ්වාසයන් සහ පිළිවෙත් ඇතුළු විවිධ මිනුම් අනුව, සමීක්ෂණය කරන ලද රටවල් ඉහළ ආගමික ස්වභාවයක් උසුලයි. නිදසුනක් ලෙස, සමීක්ෂණයට ලක් කළ රටවල් හයෙන් පහක ප්‍රතිචාර දැක්වූවන් සියල්ලන්ම පාහේ තමා ආගමික කණ්ඩායමකට සම්බන්ධ බවට හඳුන්වන අතර, ඉන්දුනීසියාවේ 98%ක් සහ ශ්‍රී ලංකාවේ 92%ක් ඇතුළුව එම රටවල් පහේම බහුතරයක් දෙනා පවසන්නේ ආගම තම ජීවිතවලට ඉතා වැදගත් බව යි.

මෙම මිනුම් දෙකෙහිම එකම ව්‍යතිරේකය වන්නේ සිංගප්පූරුව වන අතර, එහි වැඩිහිටියන්ගෙන් 22%ක් කිසිදු ආගමකට අයත් නොවන බව හඳුන්වන අතර, වැඩිහිටියන්ගෙන් 36%ක් පවසන්නේ ආගම ඔවුන්ගේ ජීවිතවලට *ඉතා* වැදගත් බව යි.

### සමීක්ෂණයට ලක් කළ රටවල බොහෝ දෙනා බෞද්ධ හෝ මුස්ලිම් ලෙස හඳුන්වයි

*එක් එක් රටෙහි ආගම්වලට අයත් වැඩිහිටියන්ගේ %*




සටහන: "වෙනත් ආගමක්" කොටසට ඇතුළත් වන්නේ "දේශීය විශ්වාසයන්/ස්වදේශීය ආගම්" තෝරාගත් අය යි. "චීන සම්ප්‍රදායික ආගම්" පදයෙහි සම්පූර්ණ පිළිතුරු විකල්ප යෙදුම වන්නේ "ටාඕවාදී, කොන්ෆියුෂියානු හෝ චීන දේශීය ආගම් වැනි චීන සම්ප්‍රදායික ආගම්" වේ. ශ්‍රී ලංකාවේ ප්‍රතිචාර දැක්වූවන්ට "චීන සම්ප්‍රදායික ආගම්" හෝ "දේශීය විශ්වාසයන්/ස්වදේශීය ආගම්" යන විකල්ප ඉදිරිපත් නොකරන ලදී. නොදනී/ප්‍රතික්ෂේප කරමි යන ප්‍රතිචාර මෙහි නොපෙන්වයි.
මූලාශ්‍රය: සමීක්ෂණය 2022 ජුනි මස 1 සිට සැප්තැම්බර් 4 දක්වා දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් හයක වැඩිහිටියන් අතර සිදු කරන ලදී. විස්තර සඳහා ක්‍රමවේදය කියවන්න.
"දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව"

PEW RESEARCH CENTER

කෙසේ නමුත් සිංගප්පූරුව තුළ සමීක්ෂණයට ලක් කළ වැඩිහිටියන්ගෙන් අති බහුතරය පවා (87%) ඔවුන් දෙවියන් හෝ අදෘශ්‍යමාන ජීවීන් විශ්වාස කරන බවත්, දහයෙන් හතක් පමණ පිරිසක් කර්මය සහ ඉරණම පවතින බව විශ්වාස කරන බවත් පවසති. සමීක්ෂණය කළ සියලුම රටවල් පුරා මෙම විශ්වාසයන් පොදුවේ පවතින අතර, වින, ශාප හෝ වෙනත් මායා බලයන්ට මිනිසුන්ගේ ජීවිතයට බලපෑම් කළ හැකි බවට වන මතය ද පවතී. සිංගප්පූරුවේ 55%ක් සහ කාම්බෝජයේ 78%ක් ඇතුළුව සෑම රටකම දළ වශයෙන් වැඩිහිටියන් අඩක් හෝ ඊට වැඩි පිරිසක් මෙම මතය දරති.

## සමීක්ෂණය කරන ලද සියලුම රටවල්වල බහුතරයක් ජනයා දෙවියන් හෝ අදෘශ්‍යමාන ජීවීන් විශ්වාස කරයි

*එක් එක් රටේ පහත පරිදි පවසන්නන්ගේ %*

| | දෙවියන් හෝ අදෘශ්‍යමාන ජීවීන් විශ්වාස කරයි | කර්මය පවතින බව සිතයි | ඉරණම පවතින බව සිතයි | තම ජීවිතයට ආගම ඉතා වැදගත් බව සලකයි | වින, ශාප හෝ වෙනත් මායා බලයන් මිනිසුන්ගේ ජීවිතයට බලපෑම් කරන බව සිතයි | දිනපතා යාච්ඥා කරයි | නිතිපතා සුවඳ දුම් පත්තු කරයි | නිතිපතා භාවනා කරයි | අවම වශයෙන් වසරකට කිහිප වරක්වත් අදෘශ්‍යමාන බලවේගවලින් ආරක්ෂාව ලබන හෝ පීඩනයට ලක්වන බව දැනේ |
|---|---|---|---|---|---|---|---|---|---|
| කාම්බෝජය | 78% | 97% | 90% | 67% | 78% | 23% | 96% | 22% | 43% |
| ඉන්දුනීසියාව | 100 | 85 | 95 | 98 | 55 | 95 | 7 | 7 | 25 |
| මැලේසියාව | 99 | 74 | 73 | 85 | 69 | 82 | 13 | 14 | 33 |
| සිංගප්පූරුව | 87 | 73 | 70 | 36 | 55 | 43 | 44 | 26 | 33 |
| ශ්‍රී ලංකාව | 90 | 88 | 85 | 92 | 54 | 76 | 92 | 62 | 33 |
| තායිලන්තය | 81 | 95 | 86 | 65 | 49 | 30 | 84 | 62 | 24 |

සටහන: තද පාටින් ඉහළ අගයන් නියෝජනය වේ. ප්‍රතිචාර දැක්වූවන් දෙවියන් වහන්සේව විශ්වාස කරන්නේ ද, එසේත් නැතහොත් දෙවිවරුන් හෝ ආත්මයන් වැනි අදෘශ්‍යමාන ජීවීන් ලෝකයේ ඇතැයි සිතන්නේ ද යන්න ඔවුන්ගෙන් වෙන වෙනම විමසන ලදී. අදෘශ්‍යමාන බලයකින් ආරක්ෂාව ලැබීම සහ අදෘශ්‍යමාන බලවේගයකින් පීඩනයට පත් වීම යන හැඟීම කොපමණ වාරයක් ඇතිවේ දැයි ප්‍රතිචාර දැක්වූවන්ගෙන් වෙන වෙනම විමසන ලදී.
මූලාශ්‍රය: සමීක්ෂණය 2022 ජූනි මස 1 සිට සැප්තැම්බර් 4 දක්වා දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් හයක වැඩිහිටියන් අතර සිදු කරන ලදී. විස්තර සඳහා ක්‍රමවේදය කියවන්න.
"දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව"

**PEW RESEARCH CENTER**

මිනිසුන් නිශ්චිත ආගමික පිළිවෙත්වල යෙදෙන ප්‍රමාණය බොහෝ විට එක් එක් රටවල ආගමික සැකැස්ම හා බැඳී පවතී. නිදසුනක් ලෙස කාම්බෝජයේ (96%), ශ්‍රී ලංකාවේ (92%) සහ තායිලන්තයේ (84%) වූ අති බහුතරයක් තමන් සුවඳ දුම් පත්තු කරන බව පවසයි; මෙම රටවල් තුනම බෞද්ධ බහුතරයක් වෙසෙන රටවල් වන අතර, දකුණු ආසියාව පුරා සිටින හින්දු, ක්‍රිස්තියානි හෝ මුස්ලිම් ජාතිකයන්ට වඩා බෞද්ධයින් සුවඳ දුම් දැල්වීමට වැඩි නැඹුරුවක් දක්වයි. බෞද්ධ බහුතරයක් වෙසෙන තායිලන්තයේ සහ ශ්‍රී ලංකාවේ භාවනා කිරීම ද ඉහළම

අගයක් ගන්නා (රටවල් දෙකේම 62% බැගින්) නමුත් කලාපය පුරා සිටින හින්දු භක්තිකයන් තමා භාවනා කරන බව පැවසීමට ඇති නැඹුරුව බෞද්ධයන්ට වඩා වැඩි මට්ටමක පවතී.


මීට ප්‍රතිවිරුද්ධව, සමීක්ෂණයේ මුස්ලිම් බහුතරයක් සිටින රටවල් දෙක වන ඉන්දුනීසියාවේ සහ මැලේසියාවේ දෛනික යාඥා කිරීම වැඩිපුරම සිදුවේ. තව ද, කලාපය පුරා සිටින හින්දු, ක්‍රිස්තියානි හෝ බෞද්ධ ජනයාට වඩා මුස්ලිම්වරු දිනකට අවම වශයෙන් එක් වරක්වත් යාඥා කරන බව පැවසීමට වැඩි නැඹුරුතාවක් දක්වති.

මිනුම් ගණනාවක් සැලකීමේ දී, සිංගප්පූරුව තුළ සිටින ආගමික වශයෙන් සබැඳියාවක් නොමැති වැඩිහිටියන් මෙම කලාපයේ ආගමිකත්වය හෝ ආධ්‍යාත්මික බව අඩුවෙන්ම පෙන්නුම් කරන පුද්ගලයින් වේ. නමුත් ආගමික අනුබද්ධතාවක් නොමැති සිංගප්පූරු වැසියන්ගේ සැලකිය යුතු පිරිසක් සමහර ආගමික හෝ අධ්‍යාත්මික විශ්වාසයන් ප්‍රකාශ කිරීම හෝ පිළිවෙත් අනුගමනය කිරීම සිදු කරති. (සිංගප්පූරුවේ ආගමික අනුබද්ධතාවක් නොමැති ජනගහනය පිළිබඳ වඩාත් සවිස්තරාත්මක තොරතුරු සඳහා, "සිංගප්පූරුවේ ආගමක් ඇදහීම සිදු නොකරන පුද්ගලයින් කවුරුන් ද, සහ ඔවුන්ගේ විශ්වාස මොනවා ද?" කියවන්න.)

## වෙනත් ආගමික චරිතවලට යාඥා කිරීම හෝ ගරු බුහුමන් දැක්වීම

සමීක්ෂණය කරන ලද රටවල විවිධ ආගමික ප්‍රජාවන් එකිනෙකට වෙනස් බොහෝ ආගමික විශ්වාසයන් සහ පිළිවෙත් හවුලේ සිදු කරයි. වෙනත් ඇදහිල්ලක් හා පොදුවේ බැඳී ඇති දෙවිවරුන්ට හෝ ආගමික චරිතවලට ගරු බුහුමන් දැක්වීමේ හෝ යාච්ඤා කිරීමේ ප්‍රවණතාව පවා මීට ඇතුළත් වේ.

## ශ්‍රී ලාංකිකයන් බොහෝ අවස්ථාවල දී වෙනත් ආගම්වලට අයත් චරිතවලට යාඥා කිරීම හෝ ගරු බුහුමන් දැක්වීම සිදු කරයි




*තමන් පහත සඳහන් එක් එක් චරිතවලට යාඥා කරන බව හෝ ගරු බුහුමන් දක්වන බව පවසන්නන්ගේ%*

මූලාශ්‍රය: සමීක්ෂණය 2022 ජූනි මස 1 සිට සැප්තැම්බර් 4 දක්වා දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් හයක වැඩිහිටියන් අතර සිදු කරන ලදී. විස්තර සඳහා ක්‍රමවේදය කියවන්න.
"දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව"

**PEW RESEARCH CENTER**

නිදසුනක් ලෙස, සිංගප්පූරු බෞද්ධයන් (18%) පස් දෙනෙකුගෙන් එක් අයෙකු තමන් අල්ලාහ් දෙවියන්ට යාඥා කරන හෝ ගරු බුහුමන් දක්වන බව පවසන අතර, මැලේසියානු හින්දු භක්තිකයන්ගෙන් (47%) අඩක් පමණ පවසන්නේ තමා යේසුස් ක්‍රිස්තුස් වහන්සේට යාඥා කරන හෝ ගරු බුහුමන් දක්වන බව යි.

පොදුවේ ගත් කල, තම ප්‍රජාවට බොහෝවිට සාම්ප්‍රදායිකව සම්බන්ධයක් නොමැති දේවතාවුන්ට හෝ ආදි ශාස්තෘවරුන්ට යාච්ඤා කිරීමට හෝ ගරු බුහුමන් දැක්වීමට හින්දු භක්තිකයන් ඉහළම නැඹුරුවක් දක්වන අතර, මුස්ලිම්වරුන් මෙසේ කිරීමේ නැඹුරුව අවම වේ. නිදසුනක් ලෙස, සිංගප්පූරුවේ හින්දු භක්තිකයන්ගෙන් 66% ක් තමා යේසුස් ක්‍රිස්තුස් වහන්සේට යාඥා කරන හෝ ගෞරව කරන බව පවසන අතර එසේ කරන මුස්ලිම්වරු ප්‍රමාණය 9% ක් පමණි. ඇත්තෙන්ම සිංගප්පූරුවේ ආගමික අනුබද්ධතාවක් නොමැති වැඩිහිටියන් (16%) එම රටේ මුස්ලිම්වරුන්ට වඩා යේසුස් ක්‍රිස්තුස් වහන්සේට යාඥා කරන හෝ ගෞරව කරන බව පැවසීමට වැඩි නැඹුරුවක් දක්වති.

ඉන්දියාවට දකුණු දෙසින් පිහිටි දූපත් රාජ්‍යයක් වන ශ්‍රී ලංකාව, තම ආගමට සම්ප්‍රදායිකව සම්බන්ධ මෙන්ම සහ වෙනත් සම්ප්‍රදායන්ට සම්බන්ධ ආදි ශාස්තෘවරුන්ට සහ දෙවිවරුන්ට යාච්ඤා කරන හෝ ගෞරව කරන මිනිසුන් සිටින රටක් ලෙස කැපී පෙනේ. නිදසුනක් ලෙස, ශ්‍රී ලාංකික කිතුනුවන්ගෙන් 48% ක් පවසන්නේ ඔවුන් ආරම්භක මෙන්ම බාධක ඉවත් කරන්නෙකු ලෙස සලකනු ලබන හින්දු දෙවියකු වන ගණ දෙවියන්ට යාඥා කිරීම හෝ ගෞරව දැක්වීම සිදු කරන බව යි. නමුත් සමීක්ෂණයට ලක් කළ අනෙකුත් රටවල එසේ කරන කිතුනුවන්ගෙන් ප්‍රමාණය 5% ක් පමණ වේ. ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන්ගෙන් 71% ක් තමා බුදුරජාණන් වහන්සේට යාඥා කරන බව හෝ ගෞරව දක්වන බවසන අතර, සමීක්ෂණයට ලක් කරන ලද අනෙකුත් රටවල මුස්ලිම්වරුන් මෙසේ කරන්නේ ඉතා සුළු පිරිසකි.

බුදුරජාණන් වහන්සේ, අල්ලාහ් දෙවියන්, යේසුස් ක්‍රිස්තුන් වහන්සේ සහ ගණදෙවියන්ට අමතරව, මෙම සමීක්ෂණය මගින් මරියා තුමිය, ශිව දෙවියන්, ගුවාන්යින් සහ පොදුවේ "ආරක්ෂක ආත්මයන්" ගැන ද විමසන ලදී. මිනිසුන්ට දෙවිවරුන්, ආත්මයන් සහ ආගමික නිර්මාතෘවරුන් සමග පවතින සබඳතා පිළිබඳ වැඩි විස්තර සඳහා, 4 වැනි පරිච්ඡේදය (ඉංග්‍රීසි බසින්) කියවන්න.

# ආගමික අවමංගල්‍ය පිළිවෙත්

සමීක්ෂණය කරන ලද රටවල සියලුම ප්‍රධාන ආගමික කණ්ඩායම්වලට අවමංගල්‍ය හා සම්බන්ධ චාරිත්‍ර වැදගත් බවක් උසුලයි.

නිදසුනක් ලෙස, බෞද්ධ බහුතරයක් සිටින කාම්බෝජයේ (84%), ශ්‍රී ලංකාවේ (80%) සහ තායිලන්තයේ (80%) මෙන්ම මුස්ලිම් බහුතරයක් සිටින ඉන්දුනීසියාවේ (72%) සහ මැලේසියාවේ (61%) බොහෝ මිනිසුන්, පවුලේ අයෙකුගේ හෝ ආදරණීයයෙකුගේ අවමංගල්‍ය කටයුතු සැලසුම් කරන විට ශුද්ධ පාඨ කියවීමට හෝ දේශනා සිදු කිරීමට ආගමික නායකයෙකුට ආරාධනා කිරීම ඉතා වැදගත් බව පවසති.

## විශේෂයෙන් කාම්බෝජය, ශ්‍රී ලංකාව, තායිලන්තය තුළ පොදු ආගමික අවමංගල්‍ය පිළිවෙත්

*සෑම රටකම පවුලේ සාමාජිකයෙකුගේ/ ආදරණීයයෙකුගේ අවමංගල්‍ය කටයුතු සැලසුම් කරන්නේ නම්___ **ඉතා වැදගත්** වනු ඇතැයි පවසන්නන්ගේ %*

| | ආගමික නායකයෙකුට ආරාධනා කර ශුද්ධ පාඨ කියවීම හෝ දේශනාවක් සිදු කිරීම* | මියගිය ඥාතියාගේ ආත්මය වෙනුවෙන් පන්සලක, මුස්ලිම් පල්ලියක හෝ වෙනත් නැමදුම් ස්ථානයක දී චාරිත්‍ර ඉටු කිරීම | මියගිය ඥාතියාගේ නමින් පරිත්‍යාග සිදු කිරීම | මියගිය ඥාතියා වෙනුවෙන් වන්දනා ස්ථානයක්/පූජාසනයක් සෑදීම |
|---|---|---|---|---|
| කාම්බෝජය | 84% | 75% | 70% | 74% |
| ඉන්දුනීසියාව | 72 | 56 | 65 | 31 |
| මැලේසියාව | 61 | 46 | 58 | 29 |
| සිංගප්පූරුව | 37 | 39 | 32 | 27 |
| ශ්‍රී ලංකාව | 80 | 73 | 81 | 56 |
| තායිලන්තය | 80 | 78 | 43 | 57 |

* බෞද්ධයන්ගෙන් භික්ෂුවක් හෝ උගත් පුද්ගලයෙකු ගැන විමසන ලදී. මුස්ලිම්වරුන්ගෙන් ඉමාම් හෝ ෂෙයික්වරයෙකු ගැන විමසන ලදී. කිතුනුවන්ගෙන් පූජකයෙකු හෝ දේවගැතිවරයෙකු ගැන විමසන ලදී. හින්දු භක්තිකයන්ගෙන් පණ්ඩිත් කෙනෙකු හෝ උගත් පුද්ගලයෙකු ගැන විමසන ලදී.
සටහන: තද පාටින් ඉහළ අගයන් නියෝජනය වේ.
මූලාශ්‍රය: සමීක්ෂණය 2022 ජූනි මස 1 සිට සැප්තැම්බර් 4 දක්වා දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් හයක වැඩිහිටියන් අතර සිදු කරන ලදී. විස්තර සඳහා ක්‍රමවේදය කියවන්න.
"දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව"

PEW RESEARCH CENTER

සමීක්ෂණයට ලක් කළ බෞද්ධ බහුතරයක් වෙසෙන රටවල බොහෝ දෙනා පවසන්නේ ඥාතියා වෙනුවෙන් පන්සලක හෝ වෙනත් පූජනීය නිවසක පුද පූජා පැවැත්වීම සහ මියගිය අය වෙනුවෙන් වන්දනා ස්ථානයක් හෝ පූජාසනයක් පිහිටුවීම ඉතා වැදගත් වනු ඇති බව යි.[6] මෙම රටවල බෞද්ධයන් විසින් පූජාසන විශේෂයෙන් අගය කොට සලකයි: නිදසුනක් ලෙස,

[6] මෙහි දී අවමංගල්‍ය පූජාසනයක් යනු සාමාන්‍යයෙන් මියගිය පුද්ගලයා සිහි කිරීම වෙනුවෙන් පවුලේ සාමාජිකයෙකුගේ නිවසෙහි ඒ වෙනුවෙන්ම ඉදි කරනු ලබන උස් ස්ථානයක් විය හැක. එය නිවසක මූලික පූජාසනයෙන් (පූජාසනයක් ඇත්නම්) පැහැදිලි ලෙස වෙනස්ව හෝ වෙනත් පූජනීය වස්තූන් සමග ඒකාබද්ධව පිහිටා තිබිය හැක. අනුස්මරණ පූජාසනයක, මියගිය පුද්ගලයාගේ රූපයක්, මලක් තැබීමට ස්ථානයක්, බත් දැමීමට කුඩා භාජනයක්, බීම වර්ගයක් (බොහෝවිට තේ) හෝ හඳුන්කූරු යනාදිය අන්තර්ගත විය හැක. ආදාහනය කළ දේහයේ භස්මාවශේෂ ද පූජාසන මත තැබිය හැක.


තායිලන්ත බෞද්ධයින්ගෙන් 63%ක් පූජාසනයක් පිහිටුවීම ඉතා වැදගත් වනු ඇති බව පවසන අතර, තායිලන්ත මුස්ලිම්වරුන් ඒ ආකාරයෙන්ම වන්දනා ස්ථානයක් පිහිටුවීම වැදගත් කොට සලකන්නේ 6% ක ප්‍රමාණයකි. ඉන්දුනීසියාවේ කිතුනුවන්ගෙන් 71% ක්, මැලේසියාවේ මුස්ලිම්වරුන්ගෙන් 61% ක් සහ කාම්බෝජයේ බෞද්ධයන්ගෙන් 70% ක් ඇතුළුව මියගිය ඥාතීන්ගේ නාමයෙන් පරිත්‍යාග සිදු කිරීම ඉතා වැදගත් බව ද ආගමික කණ්ඩායම් පුරා බොහෝ අය පවසති.

සිංගප්පූරු වැසියන් සාමාන්‍යයෙන් අසල්වැසි රටවල ජනයා මෙන් මෙම එක් එක් අවමංගල්‍ය චාරිත්‍රය ඉතා වැදගත් බව පැවසීමට දක්වන නැඹුරුව අඩු නමුත්, සිංගප්පූරු වැසියන්ගෙන් අඩකට වැඩි පිරිසක් පවසන්නේ තම ආදරණීයයෙකුගේ අවමංගල්‍යයක් සැලසුම් කරන විට දී සෑම චාරිත්‍රයක්ම අවම වශයෙන් යම් තරමකට හෝ වැදගත් වනු ඇති බව යි.

සමීක්ෂණය කරන ලද රටවල් පුරා, මියගිය ආදරණීයයන් සම්බන්ධයෙන් සිදු කරන චාරිත්‍ර අවමංගල්‍ය උත්සවයෙන් පසු අවසන් නොවේ. ශ්‍රී ලංකාවේ 93% ක් සහ තායිලන්තයේ 90% ක් ඇතුළුව, සමීක්ෂණයට ලක් කළ රටවල් හයෙන් පහක (මැලේසියාව හැර) බොහෝ දෙනා පවසන්නේ ආදරණීයයෙකුගේ මරණ සංවත්සරයේ දී තම පවුලේ කෙනෙකු විසින් චාරිත්‍ර ඉටු කරන බව යි. මේ ආකාරයේ චාරිත්‍රවල දී ආගමික සීමාවන් එකිනෙක මුහුවන අතර, ශ්‍රී ලංකාව එයට ප්‍රධාන නිදසුනකි: රටේ සිටින බෞද්ධ, මුස්ලිම්, ක්‍රිස්තියානි සහ හින්දු භක්තිකයන්

## ශ්‍රී ලංකාවේ සහ තායිලන්තයේ නිවෙස් 10කින් 9ක් අවමංගල්‍ය සංවත්සරවලට අදාළ චාරිත්‍ර ඉටු කරති

*එක් එක් රටේ පහත පරිදි පවසන්නන්ගේ %*




සටහන: සොහොන් බිම් අතුගෑමට හෝ නඩත්තු කිරීමට මුදල් ගෙවීම පිළිබඳ විමසන් ලද්දේ පවුලේ සොහොන් බිමක් ඇති අයගෙන් පමණි. කෙසේ නමුත්, මෙහි ඇති සංඛ්‍යා මගින් පෙන්වන්නේ එක් එක් ක්‍රියාකාරකම සිදු කරන මුළු ජනගහනයේ කොටස යි.
මූලාශ්‍රය: සමීක්ෂණය 2022 ජූනි මස 1 සිට සැප්තැම්බර් 4 දක්වා දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් හයක වැඩිහිටියන් අතර සිදු කරන ලදී. විස්තර සඳහා ක්‍රමවේදය කියවන්න.
"දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව"

PEW RESEARCH CENTER

දහයෙන් අටක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් පවසන්නේ එවැනි මරණ සංවත්සරයක් දී තම නිවසේ කෙනෙකු විසින් චාරිත්‍ර ඉටු කරන බව යි.

පවුලේ මියගිය සාමාජිකයින්ගේ භස්මාවශේෂ තැන්පත් කළ පවුල් සොහොන් බිමක් තිබීම මෙම රටවල්වල සාමාන්‍ය දෙයකි. සමීක්ෂණයට ලක් කළ රටවල් හයෙන් පහක (මෙවර ශ්‍රී ලංකාව හැර) ප්‍රතිචාර දැක්වූවන්ගෙන් අඩක් පමණ පවසන්නේ මෙය යි. පවුලේ සොහොන් බිමක් ඇති අයගෙන් බොහෝ අය පවසන්නේ ඔවුන්ම එය අතුගා හෝ පිරිසිදු කර රැකබලා ගන්නා බව යි. මිනිසුන් මුදල් ගෙවා පවුලේ සොහොන් බිමක් නඩත්තු කිරීම සාමාන්‍යයෙන් සිදු වන්නේ අඩුවෙනි.

# සමහර මිනුම් අනුව වයසක වැඩිහිටියන් තරුණ වැඩිහිටියන්ට වඩා ආගමික බවින් යුක්ත වේ

Pew Research Center මෙම රටවල් බොහොමයක ආගම පිළිබඳ පුළුල්, ජාතික සමීක්ෂණයක් සිදු කළ පළමු අවස්ථාව මෙය වන බැවින්, කාලයත් සමග ආගමික විශ්වාසයන් සහ පිළිවෙත් වෙනස් වන ආකාරය සොයා බැලීමේ ඉඩප්‍රස්ථාවන් සීමිත ය.[7] නමුත් මහළු හා තරුණ වැඩිහිටියන් අතර පවතින වෙනස්කම් මගින් එක් එක් රට ආගමික වශයෙන් වෙනස් වන ආකාරය පිළිබඳ ඉඟි ලබාගත හැක.[8]

සමීක්ෂණයට ලක් කරන ලද රටවල් හයෙන් පහක තරුණ සහ මහළු වැඩිහිටියන්ගේ සාර්වත්‍රික පංගුවක් ආගමක් හා සම්බන්ධව සිටී. සිංගප්පූරුවේ පමණක් තරුණ වැඩිහිටියන් (වයස අවුරුදු 18 සිට 34 දක්වා) මහළු වැඩිහිටියන්ට වඩා ආගමක් හා සම්බන්ධ නොවී සිටීමට තරමක් වැඩි නැඹුරුතාවක් දක්වයි (26% ට එදිරිව 20%).

[7] 2011-2012 කාලයේ දී Pew Research Center විසින් ඉන්දුනීසියාව සහ මැලේසියාව ඇතුළු ලොව පුරා සැලකිය යුතු මුස්ලිම් ජනගහනයක් සිටින රටවල් හි සමීක්ෂණය කරන ලදී. (පෙර සමීක්ෂණයට තායිලන්ත මුස්ලිම්වරුන් ද ඇතුළත් වූ නමුත් සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලැබුවේ තායිලන්තයේ දකුණුදිග පළාත්වල පමණි.) ප්‍රශ්නවල වචන යෙදීම සහ පරිවර්තනයේ වෙනස්කම් සැලකිල්ලට ගනිමින් ආගමිකත්වය පිළිබඳව 2011-2012 සමීක්ෂණය සහ 2022 සමීක්ෂණය අතර සිදු කළ හැකි සැසඳීම් සීමිත නමුත්, සොයාගැනීම්වලින් පෙනී යන්නේ දෙරටේ මුස්ලිම්වරු එම අවස්ථා දෙකේදී ම බොහෝ සෙයින් ආගමික වී ඇති බව යි. නිදසුනක් ලෙස, 2011-2012 සමීක්ෂණයේ දී, ඉන්දුනීසියානු සහ මැලේසියානු මුස්ලිම්වරුන් අවම වශයෙන් දහයෙන් නවයක්වත් තම ජීවිතයට ආගම ඉතා වැදගත් බව පැවසූ අතර, රටවල් දෙකෙහිම මුස්ලිම්වරුන් අවම වශයෙන් දහයෙන් නවයක් නව සමීක්ෂණයේ දී එම අදහස ම පළ කරති. 2022 මැලේසියානු සමීක්ෂණය දුරකථනය ඔස්සේ සිදු කරනු ලැබූ අතර, 2011-2012 මැලේසියානු සමීක්ෂණය මුහුණට මුහුණ ලා සිදු කරන ලදී.

[8] කෙසේ නමුත්, මහළු සහ තරුණ ප්‍රතිචාර දක්වන්නන් අතර පවතින වෙනස්කම් හරහා කාලයත් සමග ජන සමාජයක සිදුවන වෙනස්වීම් ආවශ්‍යයෙන් පෙන්නුම් නොකරයි. සමහර සන්දර්භයන් තුළ, වැඩිහිටියන් වයස්ගත වෙද්දී වඩාත් ආගමික වීමට නැඹුරු වන අතර, සමහර විට ඊට හේතුව විවාහ වී දරුවන් ලැබීම හෝ මරණයට සමීප වීම විය හැක.


කෙසේ නමුත්, සමීක්ෂණය කරන ලද රටවල් පුරාවට සම්මත මිනුම් අනුව මහළු වැඩිහිටියන් වයස 18 සිට 34 දක්වා වූ තරුණ වැඩිහිටියන්ට වඩා ආගමික වීමේ නැඹුරුවක් පවතින අතර - එය ලොව පුරා ආගමිකත්වය කෙරෙහි වයස් පරතරයේ බලපෑම පිළිබඳ 2018 Center විශ්ලේෂණයක දක්නට ලැබෙන පුළුල් රටාවලට අනුපාත වේ.

නිදසුනක් ලෙස, තායිලන්තයේ, කාම්බෝජයේ, සිංගප්පූරුවේ සහ ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 35 සහ ඊට වැඩි පුද්ගලයින් තරුණ වැඩිහිටියන්ට වඩා තම ජීවිතයට ආගම ඉතා වැදගත් බව පැවසීමට වඩා නැඹුරුවක් පවතී. (සමීක්ෂණය කරන ලද මුස්ලිම් බහුතරයක් සිටින රටවල් දෙකෙහි මෙවන් නැඹුරුවක් නොමැති අතර, වයස් කාණ්ඩ අතර මෙම මිනුමෙහි ඇත්තේ සුළු වෙනසකි.)


සමීක්ෂණය කරන ලද බොහෝ රටවල් පුරා, මහළු වැඩිහිටියන් ද තම ආදරණීයයෙකුගේ අවමංගල්‍ය කටයුතු සඳහා විවිධ ආගමික ක්‍රියාකාරකම් ඉතා වැදගත් බව පැවසීමට ඇති නැඹුරුව සාමාන්‍යයෙන් තරුණ වැඩිහිටියන්ට වඩා ඉහළ ය.

## තරුණ වැඩිහිටියන් තම වැඩිහිටියන්ට වඩා ආත්ම පිළිබඳ විශ්වාසයට තරමක් වැඩි නැඹුරුවක් දක්වති.


එක් එක් රටක සිටින ආගම තම ජීවිතවලට ඉතා වැදගත් බව පවසන්නන්ගෙ' %




එක් එක් රටක සිටින පවුලේ කෙනෙකුගේ/ආදරණීයයෙකුගේ අවමංගල්‍ය කටයුතු සැලසුම් කරන්නේ නම්, මියගිය ඥාතියාගේ ආත්මය වෙනුවෙන් පන්සලක, මුස්ලිම් පල්ලියක හෝ වෙනත් නැමදුම් ස්ථානයක දී චාරිත්‍ර ඉටු **කිරීම ඉතා වැදගත්** බව පවසන්නන්ගේ %




එක් එක් රටක සිටිනලෝකයේ දෙවියන් හෝ ආත්මයන් වැනි අදෘශ්‍යමාන ජීවීන් සිටින බව සිතන්නන්ගේ %




සටහන: සංඛ්‍යානමය වශයෙන් වැදගත් වෙනස්කම් තද පැහැයෙන් ඉස්මතු කර ඇත. වටැයීමට පෙර වෙනස්කම් ගණනය කර ඇත.
මූලාශ්‍රය: සමීක්ෂණය 2022 ජුනි මස 1 සිට සැප්තැම්බර් 4 දක්වා දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් හයක වැඩිහිටියන් අතර සිදු කරන ලදී. විස්තර සඳහා ක්‍රමවේදය කියවන්න.
"දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව"

**PEW RESEARCH CENTER**

නිදසුනක් ලෙස, සිංගප්පූරුවේ මහළු වැඩිහිටියන් දහයෙන් හතරක් පවසන්නේ තමා පවුලේ සාමාජිකයෙකුගේ හෝ ආදරණීයයෙකුගේ අවමංගල්‍යයක් සැලසුම් කරන්නේ නම්, මියගිය ඥාතියාගේ ආත්මය වෙනුවෙන් පන්සලක, මුස්ලිම් පල්ලියක හෝ වෙනත් නැමදුම් ස්ථානයක චාරිත්‍ර ඉටු කිරීම ඉතා වැදගත් බව යි. සිංගප්පූරුවේ තරුණ වැඩිහිටියන්ගෙන් තුනෙන් එකක් පමණක් මෙම අදහස දරති.

කෙසේ නමුත්, බොහෝ ආගමික ක්‍රියාකාරකම් සහ විශ්වාසයන් සම්බන්ධයෙන් මහළු හා තරුණ පුද්ගලයින් බොහෝ දුරට සමාන මත දරති. නිදසුනක් ලෙස, රටවල් හයේම මහළු හා තරුණ වැඩිහිටියන්ගේ සමාන පිරිසක් පවසන්නේ ඔවුන් ආශීර්වාදයි හෝ ආරක්ෂාව තකා විශේෂ වස්තූන් භාවිතා කරන බව යි.


එපමණක් නොව, රටවල් කිහිපයක මහළු වැඩිහිටියන් (වයස අවුරුදු 35 සහ ඊට වැඩි) තමා දෙවිවරුන් හෝ ආත්මයන් වැනි අදෘශ්‍යමාන ජීවීන් විශ්වාස කරන බව පැවසීමට ඇති නැඹුරුව තරුණ වැඩිහිටියන්ට වඩා තරමක් අඩු මට්ටමක පවතී. නිදසුනක් ලෙස, වැඩිහිටි මැලේසියානුවන්ගෙන් 61% ක් ලෝකයේ අදෘශ්‍යමාන ජීවීන් සිටින්නේ යැයි සිතන බව පවසන අතර, එම රටේම තරුණ වැඩිහිටියන්ගෙන් එම මතය දරන්නේ 67% කි.

රටවල් කිහිපයක, යමෙකු බුදුදහම අත්හැර වෙනත් ආගමකට යාම පිළිගත හැකි බව පැවසීමට නැඹුරුවක් දක්වන තරුණ බෞද්ධ වැඩිහිටියන් ප්‍රමාණය මහළු බෞද්ධයන්ට වඩා වැඩි ය. නිදසුනක් ලෙස, බුදුදහම අත්හැර යාම පිළිගත හැකි බව පැවසීමට නැඹුරු තරුණ තායිලන්ත බෞද්ධයන් ප්‍රමාණය මහළු බෞද්ධයින්ට වඩා දෙගුණයක් වේ (46% සහ 22%).

මුස්ලිම්වරුන් අතර, සිංගප්පූරුවේ පමණක් ඉස්ලාමය අත්හැර වෙනත් ආගමකට යාම පිළිගත හැකි බව පැවසීමට නැඹුරු තරුණ වැඩිහිටියන් ප්‍රමාණය මහළු මුස්ලිම්වරුන්ට වඩා වැඩි ය(25% සහ 9%).

## තරුණ බෞද්ධයන් වැඩි පිරිසක් බුද්ධාගමෙන් වෙනත් ආගමකට හැරීම පිළිගනී

*යමෙකු බුද්ධාගම අත්හැර වෙනත් ආගමකට යාම අනුමත කළ හැකි බව පවසන එක් එක් රටෙහි බෞද්ධයින්ගේ %*




සටහන: සංඛ්‍යානමය වශයෙන් වැදගත් වෙනස්කම් තද පැහැයෙන් ඉස්මතු කර ඇත. වටැයීමට පෙර වෙනස්කම් ගණනය කර ඇත. ඉන්දුනීසියාවේ සහ මැලේසියාවේ වයස අනුව බෞද්ධ ප්‍රතිචාර දක්වන්නන් විශ්ලේෂණය කිරීමට ප්‍රමාණවත් සාම්පල ප්‍රමාණය නොමැත.
මූලාශ්‍රය: සමීක්ෂණය 2022 ජූනි මස 1 සිට සැප්තැම්බර් 4 දක්වා දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් හයක වැඩිහිටියන් අතර සිදු කරන ලදී. විස්තර සඳහා ක්‍රමවේදය කියවන්න.
"දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව"

PEW RESEARCH CENTER

## පැති තීරුව: කලාපීය ආර්ථික වර්ධනය ජනයා පුළුල් ලෙස ආගම්වලින් ඈත් වීමට හේතු වී නොමැත

සමාජ විද්‍යාවන්හි පවතින න්‍යායකින් උපකල්පනය කරන්නේ රටවල් ආර්ථික වශයෙන් දියුණුව කරා යන විට සහ විද්‍යාව එදිනෙදා ජීවිතයේ දී වඩාත් ප්‍රමුඛ භූමිකාවක් ඉටු කරන විට එහි ජනයාගේ ආගමිකභාවය හීන වී යාමට නැඹුරු වන බවත්, එය බොහෝ විට පුළුල් සමාජ වෙනසක් ඇති කිරීමට හේතුවන බවත් ය. “අනාගමිකකරණ න්‍යාය” ලෙස හඳුන්වනු ලබන, එය විශේෂයෙන්ම බටහිර යුරෝපීය රටවල දෙවන ලෝක සංග්‍රාමයේ අවසානයේ සිට වර්තමානය දක්වා අත්දැකීම් පිළිබිඹු කරන නමුත්, ඒ පිළිබඳ මූලයන් ඊට පෙර ඉතිහාස ලියවිලිවල දක්නට ලැබේ.

මෑත දී සිදු කළ ශාස්ත්‍රීය පර්යේෂණයක් මගින් ආර්ථික සංවර්ධනය තුළින් පැන නඟින ආගමිකත්වයේ වෙනස් වීම් වඩාත් සීමාසහිත බවත්, එය මිනිසුන් දරන විශ්වාසයන්ටත් වඩා ආගමක් හා සම්බන්ධව සිටීමේ හෝ යාච්ඤා මෙහෙයට සහභාගී වීමේ මට්ටම් සමග බැඳී ඇති බවත් හඟවන නමුත්, අනෙකුත් අය තර්ක කරන්නේ මෑත කාලය තුළ අනාගමිකකරණය නොසිතූ ලෙස වැඩි වී ඇති බව යි. Pew Research Center හි මීට පෙර සමීක්ෂණයෙන් සොයාගන්නා ලද්දේ ඉන්දියාව තුළ මෙම අනාගමිකකරණ න්‍යායට ඇති අනුකූලතාව අවම බව යි.

ශ්‍රී ලංකාව සහ අග්නිදිග ආසියාව සම්බන්ධ දත්ත මේ පිළිබඳ මධ්‍යස්ථ බවක් පෙන්නුම් කරන අතර, සමහර අවස්ථාවල ඉහළ ආර්ථික සංවර්ධනය අඩු ආගමිකත්වය සමග සහසම්බන්ධයක් දක්වන බව පෙනෙන්නට ඇති නමුත් වෙනත් බොහෝ අවස්ථාවල එවැනි සහසම්බන්ධයක් දක්නට නොලැබේ. නිදසුනක් ලෙස, සිංගප්පූරුවේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (GDP), සමීක්ෂණයට ලක් කළ වෙනත් ඕනෑම රටක GDP මෙන් හතර ගුණයක් පමණ විශාල අතර, එමෙන්ම ආගමික අනුබද්ධතාවක් නොමැති විශාලතම ජන කොට්ඨාශය සිටින්නේ සිංගප්පූරුව තුළ යි. ආගම තම ජීවිතයට ඉතා වැදගත් බව පවසන කුඩාම ජන ප්‍රතිශතය සිටින්නේ ද සිංගප්පූරුවේ ය.

කෙසේ නමුත් සිංගප්පූරු වැඩිහිටියන් වෙනත් මිනුම් අනුව අසල්වැසි රටවල සිටින ආගමිකයන් තරමටම ආධ්‍යාත්මික හෝ ආගමික බවක් පෙන්නුම් කරයි. නිදසුනක් ලෙස, සිංගප්පූරු වැඩිහිටියන්ගෙන් 87% ක පිරිසක් දෙවියන් වහන්සේ හෝ අදෘශ්‍යමාන ජීවීන් විශ්වාස කරන බව පවසන අතර, එය කාම්බෝජයට (78%) හෝ තායිලන්තයට (81%) වඩා වැඩි පිරිසකි. මේ අතර, සිංගප්පූරු ජාතිකයින් (55%), ඉන්දුනීසියානුවන් (55%) සහ ශ්‍රී ලාංකිකයන් (54%) ආසන්න වශයෙන් සමාන පිරිසක් පවසන්නේ වින, ශාප හෝ වෙනත් මායා බලයන් මිනිසුන්ගේ ජීවිතවලට බලපෑම් කළ හැකි බව යි.

එපමණක් නොව, සමීක්ෂණයට ලක් කළ රටවල් හයම පසුගිය වසර 30 තුළ ශක්තිමත් ආර්ථික වර්ධන වේගයක් අත්කරගෙන ඇත. 2022 දී ගෝලීය ඒක පුද්ගල GDP අගය එය 1990 දී මෙන් තුන් ගුණයක් බවට පත්ව ඇති නමුත් සමීක්ෂණය කරන ලද රටවල් හයේ පසුගිය දශක තුන තුළ ඒක පුද්ගල GDP අගය ආසන්න වශයෙන් සිව් ගුණයකින් වැඩි කරගෙන ඇත (හෝ ඊටත් වඩා ශක්තිමත් වේගයකින් වර්ධනය වේ). මෙම වර්ධන වේගයන් අබියස ද වර්තමානයේ ආගමකට සම්බන්ධ නොවී සිටින වැඩිහිටියන් සිටින්නේ ඉතා සුළු පිරිසකි (සිංගප්පූරුවේ හැර).

## ඉහළ අධ්‍යාපනය සහ ආගමිකත්වය හීන වී යාම අතර සාර්වත්‍රික බැඳීමක් නොමැත

| | ගම්බද | නාගරික | වෙනස | අඩු අධ්‍යාපනය | ඉහළ අධ්‍යාපනය | වෙනස |
|---|---|---|---|---|---|---|
| *එක් එක් රටක ආගම තම ජීවිතයට **ඉතා වැදගත්** බව පවසන්නන්ගේ%* | | | | | | |
| කාම්බෝජය | 68% | 65% | +3 | 69% | 54% | **+15** |
| ඉන්දුනීසියාව | 99 | 97 | **+2** | 98 | 98 | +1 |
| මැලේසියාව | 85 | 85 | +1 | 86 | 80 | **+5** |
| සිංගප්පූරුව | -- | -- | -- | 42 | 32 | **+9** |
| ශ්‍රී ලංකාව | 92 | 94 | -2 | 96 | 90 | **+6** |
| තායිලන්තය | 66 | 64 | +2 | 71 | 53 | **+18** |
| *එක් එක් රටක සිටින කර්මය විශ්වාස කරන බව පවසන්නන්ගේ%* | | | | | | |
| කාම්බෝජය | 97 | 97 | 0 | 98 | 95 | +3 |
| ඉන්දුනීසියාව | 84 | 86 | -2 | 84 | 86 | -2 |
| මැලේසියාව | 74 | 74 | 0 | 75 | 68 | **+7** |
| සිංගප්පූරුව | -- | -- | -- | 76 | 72 | +4 |
| ශ්‍රී ලංකාව | 89 | 83 | **+6** | 86 | 89 | -3 |
| තායිලන්තය | 95 | 95 | 0 | 95 | 94 | +2 |
| එක් එක් රටක සිටින *ලෝකයේ දෙවියන් හෝ ආත්මයන් වැනි අදෘශ්‍යමාන ජීවීන් සිටින බව සිතන්නන්ගේ%* | | | | | | |
| කාම්බෝජය | 71 | 74 | -4 | 73 | 68 | +5 |
| ඉන්දුනීසියාව | 66 | 68 | -2 | 63 | 74 | **-11** |
| මැලේසියාව | 58 | 67 | **-8** | 62 | 73 | **-10** |
| සිංගප්පූරුව | -- | -- | -- | 65 | 76 | **-10** |
| ශ්‍රී ලංකාව | 56 | 55 | +1 | 56 | 55 | +1 |
| තායිලන්තය | 69 | 72 | -3 | 69 | 75 | **-6** |
| *එක් එක් රටක සිටිනමියගිය ඥාතියෙකුගේ අවමංගල්‍ය කටයුතු සඳහා වන්දනා ස්ථානයක් හෝ පූජාසනයක් පිහිටුවීම **ඉතා වැදගත්** බව පවසන්නන්ගේ%* | | | | | | |
| කාම්බෝජය | 75 | 72 | +3 | 76 | 64 | **+12** |
| ඉන්දුනීසියාව | 35 | 27 | **+7** | 38 | 18 | **+19** |
| මැලේසියාව | 33 | 26 | **+7** | 30 | 17 | **+13** |
| සිංගප්පූරුව | -- | -- | -- | 36 | 22 | **+13** |
| ශ්‍රී ලංකාව | 56 | 51 | +5 | 65 | 51 | **+14** |
| තායිලන්තය | 61 | 53 | **+7** | 62 | 47 | **+16** |

සටහන: සංඛ්‍යානමය වශයෙන් වැදගත් වෙනස්කම් තද පැහැයෙන් ඉස්මතු කර ඇත. වටැයීමට පෙර වෙනස්කම් ගණනය කර ඇත. සිංගප්පූරුව සම්පූර්ණයෙන්ම "නාගරික" ලෙස වර්ගීකරණය කර ඇති බැවින් එහි ග්‍රාමීය-නාගරික සැසඳීම් කළ නොහැක. මැලේසියාවේ "උප නාගරික" කොටස්"නාගරික" කොටසෙහි ඇතුළත් කර ඇත. රටවල් පුරා අධ්‍යාපනික කොටස් සංසන්දනය කිරීමේ අරමුණ ඇතිව අපි අධ්‍යාපන මට්ටම් එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ප්‍රමිති වර්ගීකරණය පදනම් කොටගෙන ප්‍රමිතිකරණය කරමු. කාම්බෝජය, ඉන්දුනීසියාව, ශ්‍රී ලංකාව සහ තායිලන්තය යන රටවල පහළ අධ්‍යාපන කාණ්ඩය ද්විතීයික අධ්‍යාපනයට පහළින් ද, උසස් කාණ්ඩය ද්විතියික අධ්‍යාපන මට්ටමේ හෝ ඊට ඉහළින් ද පවතී. මැලේසියාවේ සහ සිංගප්පූරුවේ පහළ අධ්‍යාපන කාණ්ඩය ද්විතීයික අධ්‍යාපන මට්ටමේ හෝ ඊට පහළින් ද, ඉහළ කාණ්ඩය පශ්චාත් ද්විතීයික මට්ටමේ හෝ ඊට ඉහළින් පවතී.
මූලාශ්‍රය: සමීක්ෂණය 2022 ජුනි මස 1 සිට සැප්තැම්බර් 4 දක්වා දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් හයක වැඩිහිටියන් අතර සිදු කරන ලදී. විස්තර සඳහා ක්‍රමවේදය කියවන්න.

නාගරික පරිසරයක ජීවත් වන්නන් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන්නන් තරමට ම පුළුල් ලෙස ආගමික හෝ අධ්‍යාත්මික බවක් පෙන්වති. නිදසුනක් ලෙස, මැලේසියාවේ නාගරික සහ ග්‍රාමීය පදිංචිකරුවන්ගෙන් 74%ක් පවසන්නේ ඔවුන් කර්මය විශ්වාස කරන බව යි.[9] ග්‍රාමීය ජනතාව නාගරික වැසියන්ට වඩා වැඩියෙන් අවමංගල්‍ය පිළිවෙත් කිහිපයක් අනුගමනය කරති. නිදසුනක් ලෙස, ඉන්දුනීසියාවේ නාගරික ඉන්දුනීසියානුවන් අතර 27% ක පිරිස හා සසඳන විට, ඉන්දුනීසියාවේ ග්‍රාමීය වැසියන්ගෙන් 35% ක් පවසන්නේ පවුලේ සාමාජිකයෙකුගේ අවමංගල්‍යයක් සැලසුම් කිරීමේ දී වන්දනා ස්ථානයක් පිහිටුවීම ඉතා වැදගත් බව යි.

අධ්‍යාපන සාමාර්ථය සහ ආගම අතර තරමක් ශක්තිමත් සම්බන්ධයක් පවතී. වැඩි අධ්‍යාපනයක් ලබා ඇති පුද්ගලයින් අතර ආගමික බැඳීම සම්බන්ධ මිනුම් කිහිපයක් දක්නට ලැබෙන්නේ අඩුවෙනි. නිදසුනක් ලෙස, අවම වශයෙන් ද්විතීයික අධ්‍යාපනයක් හෝ ලබා ඇති කාම්බෝජ ජාතිකයන් තම ජීවිතයට ආගම ඉතා වැදගත් බව පැවසීමට (54% එදිරිව 69%) හෝ මියගිය ඥාතියෙකුගේ අවමංගල්‍යයක් සඳහා වන්දනා ස්ථානයක් පිහිටුවීම ඉතා වැදගත් බව පැවසීමට ඇති නැඹුරුව වෙනත් කාම්බෝජ ජාතිකයින්ට වඩා අඩු ය (64% එදිරිව 76%).

නමුත් ඉහළ අධ්‍යාපනයත් සමග ආගමික විශ්වාසය අඩු වීමේ රටාවක් නොපෙන්වන විශ්වාසයන් සහ පිළිවෙත් ගණනාවක් තිබේ. නිදසුනක් ලෙස, පුද්ගලයෙකුගේ අධ්‍යාපන මට්ටම කුමනාකාර වුවත් එක් එක් රට තුළ කර්මය පිළිබඳ විශ්වාස කරන පිරිස ආසන්න වශයෙන් සමාන අගයක් ගනී. තව ද ඉහළ අධ්‍යාපනයක් ඇති පුද්ගලයින් තමා දෙවිවරුන් හෝ ආත්මයන් වැනි අදෘශ්‍යමාන ජීවීන් ලෝකයේ ඇතැයි සිතන බව පැවසීමට ඇති නැඹුරුව වෙනත් වැඩිහිටියන්ට වඩා *වැඩි* ය. නිදසුනක් ලෙස සිංගප්පූරුවේ අනෙකුත් සිංගප්පූරු වැසියන්ගෙන් 65% හා සසඳන විට, විද්‍යාල අධ්‍යාපනය ලැබූ වැඩිහිටියන්ගෙන් 76% ක් විශ්වාස කරන්නේ අදෘශ්‍යමාන ජීවීන් සිටින බව යි.

[9] මැලේසියාවේ "උප නාගරික" කොටස්"නාගරික" කොටසෙහි ඇතුළත් කර ඇත.

# කිතුනු හෝ ආගමික අනුබද්ධතාවක් නොමැති ලෙස හඳුන්වන සිංගප්පූරු වැසියන්ගේ ප්‍රමාණය ඉහළ යමින් පවතී

සමීක්ෂණය කරන ලද අනෙකුත් රටවලට වඩා සිංගප්පූරුව වෙනස් වන්නේ එයට බහුතර ආගමක් නොමැති වීමත් ඒ අනුව සිංගප්පූරු ජාතික අනන්‍යතාවය සමග පැහැදිලිව සම්බන්ධ වූ තනි ආගමක් නොමැති වීමත් හේතුවෙනි.

එය තවත් ආකාරයකින් කැපී පෙනෙන හේතුවක් වන්නේ: වෙනත් රටවල සිටින වැඩිහිටියන් සියලුදෙනා පාහේ තමා හැදී වැඩුණු ආගමට සම්බන්ධව සිටින නමුත් සිංගප්පූරු ජාතිකයින් එසේ සිටින්නේ ඉතා සුළු පිරිසක් වීම යි (64%). මෙම "ආගමික මාරුව" විශේෂයෙන්ම බෞද්ධ හෝ චීන සම්ප්‍රදායික ආගම් අනුගාමිකයින් ලෙස හඳුනා ගන්නා සිංගප්පූරු වැසියන් පිරිස පහත වැටීමටත්, කිතුනු හෝ ආගමිකව සම්බන්ධ නොවූ පිරිස් *වැඩි වීමටත්* හේතු වී ඇත.

## සිංගප්පූරුවේ බොහෝ වැඩිහිටියන් බෞද්ධ, සහ චීන සාම්ප්‍රදායික ආගමික අනන්‍යතා වලින් බැහැර වෙමින් සිටී

*හැදී වැඩුණු/වර්තමානයේ... **සිංගප්පූරුවේ වැඩිහිටියන්ගේ**%*

| | හැදී වැඩුණු | වර්තමාන | ශුද්ධ වෙනස |
|---|---|---|---|
| බෞද්ධ | 32% | 26% | **-6** |
| මුස්ලිම් | 17 | 18 | 0 |
| ක්‍රිස්තියානි | 11 | 17 | **+6** |
| හින්දු | 8 | 8 | 0 |
| චීන සම්ප්‍රදායික ආගම් අනුගාමිකයෙක් | 15 | 6 | **-10** |
| වෙනත් ආගම් | 3 | 4 | +1 |
| ආගමක් නැත | 13 | 22 | **+9** |

සටහන: "චීන සම්ප්‍රදායික ආගම්" පදයෙහි සම්පූර්ණ පිළිතුරු විකල්ප යෙදුම වන්නේ "ටාඕවාදී, කොන්ෆියුෂියානු හෝ චීන දේශීය ආගම් වැනි චීන සම්ප්‍රදායික ආගම්" වේ. තම වර්තමාන හෝ හැදී වැඩුණුආගම හෙළි නොකළ හෝ "දේශීය විශ්වාසයන්/ස්වදේශීය ආගම්" තෝරූ ප්‍රතිචාර දක්වන්නන් කුඩා ප්‍රමාණය "වෙනත් ආගම්" කාණ්ඩයට ඇතුළත් කොට ඇත. සංඛ්‍යානමය වශයෙන් වැදගත් වෙනස්කම් තද පැහැයෙන් ඉස්මතු කර ඇත. වටැයීමට පෙර වෙනස්කම් ගණනය කර ඇත.
මූලාශ්‍රය: සමීක්ෂණය 2022 ජුනි මස 1 සිට සැප්තැම්බර් 4 දක්වා දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් හයක වැඩිහිටියන් අතර සිදු කරන ලදී. විස්තර සඳහා ක්‍රමවේදය කියවන්න.
"දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව"

PEW RESEARCH CENTER

සිංගප්පූරු වැඩිහිටියන්ගෙන් 32% ක් තමන් බෞද්ධ ලෙස හැදී වැඩුණු බව පවසන අතර, එය අද බෞද්ධයන් ලෙස හඳුන්වා ගන්නා කොටසට වඩා සැලකිය යුතු ලෙස වැඩි ප්‍රතිශතයකි (26%). ටාඕවාදය, කොන්ෆියුසියස්වාදය හෝ චීන දේශීය ආගම් වැනි චීන සම්ප්‍රදායික ආගම් අදහන්නන් ලෙස හඳුන්වන පිරිස ආශ්‍රිතව මෙම පරතරය තවත් විශාල ය: 15% ක පිරිසක් තමා මෙම සම්ප්‍රදායන් තුළ හැදී වැඩුණු බව පවසන නමුත් වර්තමානයේ චීන සම්ප්‍රදායික ආගම් හා සම්බන්ධව සිටින්නේ 6% ක් පමණි.

ඊට ප්‍රතිවිරුද්ධව, වර්තමානයේ කිතුනුවන් ලෙස හඳුන්වන සිංගප්පූරු වැසියන්ගේ කොටස තමන් කිතුනුවෙකු ලෙස හැදී වැඩුණු බව පවසන කොටසට වඩා වැඩි අගයක් ගනී (17% එදිරිව 11%). සිංගප්පූරුවේ කිසිදු ආගමක් හා සම්බන්ධයක් නොදක්වන වැඩිහිටියන් සඳහා ද එය

එසේම වේ: වැඩිහිටියන්ගෙන් 22% ක් පවසන්නේ තමා දැන් ආගමක් හා සම්බන්ධ නොමැති බව නමුත් තමන් ආගමක් නොමැතිව හැදී වැඩුණු බව පවසන්නේ 13% ක ප්‍රමාණයකි.

පසුගිය දශක කිහිපය තුළ සිංගප්පූරුවේ සංගණන වාර්තාවල මීට සමාන රටාවක් දැකගත හැක. (මෙම සංගණන දත්ත විශ්ලේෂණය සඳහා “සිංගප්පූරුවේ වෙනස් වෙමින් පවතින ආගමික අනන්‍යතාව” කියවන්න.)

නමුත් සිංගප්පූරුවේ ආගමික වෙනස්වීම පිළිබඳ කතිකාව හුදෙක් බෞද්ධයන් සහ චීන සම්ප්‍රදායික ආගම් අනුගාමිකයින් තම ළමා වියේ ඇදහිලි අත්හැර ක්‍රිස්තියානි ධර්මය වැළඳ ගැනීම හෝ කිසිදු ආගමික සම්බන්ධයක් නොමැතිව සිටීම පිළිබඳ දෙයක් නොවේ.

නිදසුනක් ලෙස, සිංගප්පූරුවේ වැඩිහිටියන්ගෙන් බෞද්ධයන් ලෙස හැදී වැඩුණු 13% ක් තවදුරටත් ඔවුන් බෞද්ධයන් ලෙස හඳුන්වා නොගන්නා නමුත් දැනට සිංගප්පූරුවේ බෞද්ධයන් ලෙස හඳුන්වා ගන්නා කොටස සියයට 6 කින් පමණක් අඩු වී ඇත්තේ එහි අනෙකුත් වැඩිහිටියන්ගෙන් (වෙනත් ආගමක හැදී වැඩුණු හෝ ආගම අනුගමනය නොකළ අයගෙන්) 7% ක් බුදුදහමට හැරී ඇති බැවිනි.

## සිංගප්පූරු වැඩිහිටියන්ගෙන් 15% ක් කුඩා කල සිටම ආගමකට සම්බන්ධයක් නොදක්වති

*සිංගප්පූරුවේ වැඩිහිටියන්ගෙන් %*

| | ආගමිකයෙකු ලෙස ___ හැදී වැඩුණු නමුත් දැන් වෙනත් අයෙකු ලෙස හඳුන්වන (එනම්, ආගමක්) අත්හැරීම වැනි | වෙනත් ආගමක හැදී වැඩුණු නමුත් දැන් ___ ලෙස හඳුන්වන (එනම්, ආගමකට ඇතුල් වීම වැනි) |
|---|---|---|
| බෞද්ධ | 13% | 7% |
| මුස්ලිම් | 0 | 1 |
| කිතුනු | 3 | 3 |
| හින්දු | 1 | 1 |
| චීන සාම්ප්‍රදායික ආගම් අනුගාමිකයෙක් | 11 | 1 |
| වෙනත් ආගමිකයෙක් | 2 | 3 |
| ආගමක් නොමැති | 6 | 15 |

සටහන: "චීන සම්ප්‍රදායික ආගම්" පදයෙහි සම්පූර්ණ පිළිතුරු විකල්ප යෙදුම වන්නේ "ටාඕවාදී, කොන්ෆියුෂියානු හෝ චීන දේශීය ආගම් වැනි චීන සම්ප්‍රදායික ආගම්" වේ. තම වර්තමාන හෝ හැදී වැඩුණු ආගම හෙළි නොකළ හෝ "දේශීය විශ්වාසයන්" තේරූ ප්‍රතිචාර දක්වන්නන් කුඩා ප්‍රමාණය "වෙනත් ආගම්" කාණ්ඩයට ඇතුළත් කොට ඇත. කෙසේ නමුත් ආගම අත්හැරීමේ තත්ත්වය තීරණය කරනු ලැබුවේ ප්‍රශ්න ප්‍රතිචාර කාණ්ඩ අතර සිදු කළ ගැලපීම් මගින් මිස ඒකාබද්ධ සමූහනයන් මගින් නොවේ.
මූලාශ්‍රය: සමීක්ෂණය 2022 ජුනි මස 1 සිට සැප්තැම්බර් 4 දක්වා දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් හයක වැඩිහිටියන් අතර සිදු කරන ලදී. විස්තර සඳහා ක්‍රමවේදය කියවන්න.
"දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව"

PEW RESEARCH CENTER

රටේ වැඩිහිටි ජනගහනයෙන් 15% ක් ළමා වියේ ඇදහූ ආගම අත්හැර අනාගමික බවට පත්ව සිටින අතර, ආගමික අනුබද්ධතාවක් නොමැති ලෙස හඳුන්වන සිංගප්පූරු වැසියන්ගේ ප්‍රමාණය *ශුද්ධ* ලකුණු 9 කින් පමණක් වැඩි වී ඇත්තේ ආගමික අනුබද්ධයක් නොමැතිව සිටි වැඩිහිටි ජනගහනයෙන් 6% ක් ආගමකට හැරී ඇති නිසාවෙනි: ඔවුන් ආගමික අනුබද්ධයක් නොමැතිව හැදී වැඩුණු නමුත් ඉන් පසු ආගමකට (බොහෝ විට බුද්ධාගමට හෝ ක්‍රිස්තියානි ධර්මයට) සම්බන්ධ වූ අය වෙති.

සිංගප්පූරුවේ අනාගත ආගමික සංයුතිය කෙරෙහි අඛණ්ඩව පවතින ආගමික විචලනය සහ වෙනත් සාධක ද බලපානු ඇති අතර, වත්මන් දෙමාපියන් තම දරුවන් ඇති දැඩි කරන බව පවසන ආකාරයයෙන් පෙනී යන්නේ බෞද්ධයන් සමස්ත ජනගහනයෙන් කොටසක් ලෙස තවදුරටත් හීන වී යාමට ඉඩ ඇති බව යි.

බෞද්ධ දෙමව්පියන්ගෙන් තුනෙන් දෙකක පිරිසක් පමණක් තම දරුවන්ව බෞද්ධ ලෙස ඇති දැඩි කරන බව පවසන අතර; දළ වශයෙන් බෞද්ධ දෙමව්පියන්ගෙන් හතරෙන් එකක් (27%) පවසන්නේ තම දරුවන් කිසිදු ආගමක් නොමැතිව ඇති දැඩි කරන බව යි. ඊට ප්‍රතිවිරුද්ධව, සිංගප්පූරුවේ මුස්ලිම් (99%) සහ ක්‍රිස්තියානි (90%) දෙමාපියන්ගෙන් ඉතා ඉහළ ප්‍රමාණයක් පවසන්නේ ඔවුන් තම දරුවන් පිළිවෙලින් මුස්ලිම්වරුන් සහ කිතුනුවන් ලෙස ඇති දැඩි කරන බව යි. එමෙන්ම ආගමික අනුබද්ධයක් නොමැතිව සිටින දෙමාපියන්ගෙන් 85%ක් තම දරුවන් ආගමික අනුබද්ධයක් නොමැතිව ම ඇති දැඩි කරන බව සමීක්ෂණයෙන් සොයාගෙන ඇත.

## පැති තීරුව: සිංගප්පූරුවේ වෙනස් වෙමින් පවතින ආගමික අනන්‍යතාව

ජාතික සංගණනයට අනුව සිංගප්පූරුවේ වත්මන් ආගමික සැකැස්ම වසර 40කට පෙර තිබූ සැකැස්මෙන් කැපී පෙනෙන වෙනසක් පෙන්වයි.[10] ශීඝ්‍ර ආර්ථික වර්ධනයට සමගාමීව, ආගමික අනුබද්ධයක් නොමැති පිරිස, වැඩිහිටි ජනගහනයෙන් 13% සිට 20% දක්වා ඉහළ ගොස් ඇත. කෙසේ නමුත්, මෙම කාල සීමාව තුළ කිතුනුවන් ප්‍රමාණය ජාතික ජනගහනයෙන් දළ වශයෙන් දෙගුණයක් දක්වා එනම් 1980 හි 10% සිට 2020 හි 19% දක්වා ඉහළ ගොස් ඇත.


සිංගප්පූරුව තුළ බෞද්ධ ජනගහනය 1980 සහ 2000 අතර (27% සිට 43% දක්වා) වැඩි වීමෙන් පසුව, 1990 කාලයේ තිබූ මට්ටමට (31% දක්වා) අඩු වී ඇත.

මේ අතර චීන සාම්ප්‍රදායික විශ්වාසයන් (ටාඕවාදය ඇතුළුව) අදහන සිංගප්පූරුවේ වැඩිහිටියන්ගේ ප්‍රමාණය 1980 දී 30% සිට 2000 දී දළ වශයෙන් ඉන් දහයෙන් එකක් දක්වා අඩු වූ අතර, එතැන් සිට සාමාන්‍යයෙන් ස්ථාවර මට්ටමක පවතී.[11]

මුස්ලිම්, හින්දු සහ වෙනත් ආගම් අදහන සිංගප්පූරු වැසියන්ගේ ප්‍රතිශතය 1980 සිට තරමක් ස්ථාවරව පවතී.

### සිංගප්පූරු වැඩිහිටියන්ගේ වැඩිවන කොටස් කිතුනු හෝ ආගමික වශයෙන් සම්බන්ධ නොවන ලෙස හඳුන්වයි

*සංගණන දත්ත අනුව එක් එක් ආගමික ප්‍රජාවට කාණ්ඩ කර ඇති **සිංගප්පූරු වැඩිහිටියන්ගේ** % වේ*




සටහන: නිදහස ලැබීමෙන් පසු පළමු සංගණනයට (1970) ප්‍රශ්නයක් ලෙස ආගම ඇතුළත් නොකරන ලදී. සීක් ආගම "අනෙකුත් ආගම්" තුළ ඇතුළත් කරන ලදී. වැඩිහිටියන් යනු වයස අවුරුදු 18 සහ ඊට වැඩි අය යි.
මූලාශ්‍රය: සිංගප්පූරු සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, දසවාර්ශික සංගණන.
"දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව"

**PEW RESEARCH CENTER**

[10] 2000, 2010 සහ 2020 සඳහා සංගණන සංඛ්‍යා ලේඛන සිංගප්පූරුවේ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙනි. 1980 සහ 1990 සඳහා වූ සංඛ්‍යාලේඛන ඉල්ලීම පරිදි ලබා දෙන ලද්දේ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසිනි.
[11] සිංගප්පූරු සංගණනයේ දී චීන සම්ප්‍රදායික විශ්වාසයන් සහ ටාඕවාදය එකට එක්ව සලකනු ලබයි.

## සිංගප්පූරුවේ ආගමක් ඇදහීම සිදු නොකරන පුද්ගලයින් කවුරුන් ද, සහ ඔවුන්ගේ විශ්වාස මොනවා ද?

රටේ සෑම අයෙකුම පාහේ ආගමික අනුබද්ධතාවක් ඇතැයි පවසන තම අසල්වැසි ජනගහනයට හාත්පසින්ම පරස්පර ලෙස, දළ වශයෙන් සිංගප්පූරු වැසියන් පස් දෙනෙකුගෙන් එක් අයෙකු කිසිදු ආගමක් ඇදහීම සිදු නොකරන අතර මෙම කණ්ඩායම සමහර අවස්ථාවල දී “අනාගමිකයන්” ලෙස හැඳින්වේ. සිංගප්පූරුවේ සිටින "අනාගමිකයන්" වැඩි වශයෙන් චීන සම්භවයක් ඇත්තවුන් වන අතර බොහෝ දුරට විද්‍යාල අධ්‍යාපනය ලැබූවන් වෙති.

සමහර මිනුම්වලට අනුව, සිංගප්පූරුවේ ආගමික අනුබද්ධතාවක් නොමැති ජනගහනය ඉතා ආගමික හෝ අධ්‍යාත්මික බවක් ඇත්තවුන් බව නොපෙනේ. නිදසුනක් ලෙස, සිංගප්පූරු වැඩිහිටියන්ගෙන් 36% ක් සමග සැසඳීමේ දී, තම ජීවිතවලට ආගම ඉතා වැදගත් බව පවසන “අනාගමිකයන්” ඇත්තේ ප්‍රමාණය 3% ක් පමණි.

නමුත් සමූහයක් ලෙස, සිංගප්පූරුවේ ආගමික අනුබද්ධතාවක් නොමැති පුද්ගලයින් ආගමික හෝ අධ්‍යාත්මික විශ්වාසයන් සහ පිළිවෙත් සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප නොකරති. සිංගප්පූරුවේ "අනාගමික" පිරිසෙන් තුනෙන් දෙකක් (65%) තමන් කර්මය පවතින බව සිතන බවත්, 43% ක් පවුලේ මියගිය සාමාජිකයන්ගේ පැවැත්ම යමෙකුට දැනෙන බවත් පවසන අතර, ඊට සාපේක්ෂව දළ වශයෙන් මුස්ලිම් (47%) සහ ක්‍රිස්තියානි (43%) ජන කොටස් ද එම මතයම දරති.

පවුලේ සාමාජිකයෙකු හෝ ආදරණීයයෙකු වෙනුවෙන් අවමංගල්‍යයක් සැලසුම් කිරීම පිළිබඳ විමසූ විට, සිංගප්පූරුවේ බොහෝ ආගමික "අනාගමිකයින්" අධ්‍යාත්මික හෝ ආගමික බවට සැලකිය හැකි ක්‍රියාකාරකම්වලට වැදගත්කමක් ලබා දෙති.

## සිංගප්පූරුවේ ආගමික 'අනාගමිකයින්' බහුතරයක් පවසන්නේ ඔවුන් දෙවියන් හෝ අදෘශ්‍යමාන ජීවීන් විශ්වාස කරන බව යි

*පහත අදහස් දරන සිංගප්පූරුවේ වැඩිහිටියන්ගේ %*

| | ඔවුන් දෙවියන් හෝ අදෘශ්‍යමාන ජීවීන් විශ්වාස කරයි | ඔවුන් කර්මය පවතින බව සිතයි | මියගිය පවුලේ සාමාජිකයෙකු සිටින බව පුද්ගලයෙකුට දැනිය හැකිය | ඔවුන් ඇස්වහ තිබෙන බව සිතයි | ඔවුන් නිතිපතා සුවඳ දුම් පත්තු කරයි | ඔවුන්ගේ ජීවිතයට ආගම ඉතා වැදගත් වේ | ඔවුන් නිතිපතා භාවනා කරයි |
|---|---|---|---|---|---|---|---|
| සාමාන්‍ය ජනගහනය | 87% | 73% | 51% | 47% | 44% | 36% | 26% |
| බෞද්ධ | 91 | 90 | 60 | 49 | 77 | 20 | 32 |
| ආගමක් නැත | 62 | 65 | 43 | 26 | 39 | 3 | 18 |
| මුස්ලිම් | 100 | 76 | 47 | 81 | 8 | 83 | 15 |
| ක්‍රිස්තියානි | 100 | 46 | 43 | 34 | 15 | 61 | 27 |
| හින්දු | 98 | 95 | 71 | 68 | 67 | 52 | 58 |
| චීන සාම්ප්‍රදායික ආගම් අනුගාමිකයින් | 90 | 86 | 68 | 52 | 86 | 13 | 20 |

සටහන: තද පාටින් ඉහළ අගයන් නියෝජනය වේ. ප්‍රතිචාර දැක්වූවන් දෙවියන් වහන්සේව විශ්වාස කරන්නේ ද, එසේත් නැතහොත් දෙවිවරුන් හෝ ආත්මයන් වැනි අදෘශ්‍යමාන ජීවීන් ලෝකයේ ඇතැයි සිතන්නේ ද යන්න ඔවුන්ගෙන් වෙන වෙනම විමසන ලදී.
මූලාශ්‍රය: සමීක්ෂණය 2022 ජූනි මස 1 සිට සැප්තැම්බර් 4 දක්වා දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් හයක වැඩිහිටියන් අතර සිදු කරන ලදී. විස්තර සඳහා ක්‍රමවේදය කියවන්න.
"දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව"

PEW RESEARCH CENTER


නිදසුනක් ලෙස, තමාට ආගමක් නොමැති බව පවසන අයගෙන් 52% ක් මියගිය ඥාතියාගේ ආත්මය වෙනුවෙන් පන්සල්වල චාරිත්‍ර පැවැත්වීම වැදගත් බව පවසන අතර 46% ක් මියගිය ඥාතියා වෙනුවෙන් පූජාසනයක් පිහිටුවීම වැදගත් බව සිතති.

සමීක්ෂණයට සහභාගී වූ සෑම කෙනෙකුගෙන්ම දෙවියන් වහන්සේව විශ්වාස කරන්නේ ද යන්නත්, දෙවිවරුන් හෝ ආත්මයන් වැනි අදෘශ්‍යමාන ජීවීන් ලෝකයේ ඇතැයි සිතන්නේ ද යන්නත් වෙන වෙනම විමසන ලදී.

ආගමික අනුබද්ධතාවක් නොමැති සිංගප්පූරු වැසියන් දහයෙන් හතරක් පමණ (41%) තමා දෙවියන් වහන්සේ විශ්වාස කරන බවත්, ඉතා සුළු බහුතරයක් (56%) ලෝකයේ අදෘශ්‍යමාන ජීවීන් සිටින්නේ යැයි සිතන බවත් පවසති. සිංගප්පූරු "අනාගමිකයන්" දළ වශයෙන් දහයෙන් හයක් පමණ (62%) මෙම විශ්වාසවලින් *අවම වශයෙන් එකක්* හෝ දරති.

## දෙවියන් වහන්සේ සහ අදෘශ්‍යමාන ජීවීන් පිළිබඳ විශ්වාස කරන සිංගප්පූරුවේ ආගමික අනුබද්ධතාවක් නොමැති බහුතරයක් කර්මය පවතින බව ද සිතයි

සිංගප්පූරුවේ ආගමික අනුබද්ධතාවක් නොමැති වැඩිහිටියන්ගෙන් ____, සහ ...%




සටහන: ප්‍රතිචාර දැක්වූවන් දෙවියන් වහන්සේව විශ්වාස කරන්නේ ද, එසේත් නැතහොත් දෙවිවරුන් හෝ ආත්මයන් වැනි අදෘශ්‍යමාන ජීවීන් ලෝකයේ ඇතැයි සිතන්නේ ද යන්න ඔවුන්ගෙන් වෙන වෙනම විමසන ලදී. සියලුම වෙනස්කම් සංඛ්‍යානමය වශයෙන් වැදගත් වේ. වටැයීමට පෙර වෙනස්කම් ගණනය කර ඇත.
මූලාශ්‍රය: සමීක්ෂණය 2022 ජූනි මස 1 සිට සැප්තැම්බර් 4 දක්වා දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් හයක වැඩිහිටියන් අතර සිදු කරන ලදී. විස්තර සඳහා ක්‍රමවේදය කියවන්න.
"දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව"

PEW RESEARCH CENTER

දෙවියන් සහ/හෝ අදෘශ්‍යමාන ජීවීන් විශ්වාස කිරීමට නැඹුරු "අනාගමික" ගැහැණු ප්‍රමාණය එසේ විශ්වාස කරන ආගමික අනුබද්ධතාවක් නොමැති පිරිමින්ට වඩා වැඩි ය (68% එදිරිව 57%). එසේම ආගමක

හැදී වැඩුණු නමුත් වැඩිහිටියෙකු ලෙස ආගමික අනුබද්ධතාවක් නොමැති සිංගප්පූරු වැසියන් දෙවියන් හෝ අදෘශ්‍යමාන ජීවීන් විශ්වාස කිරීමට වැඩි නැඹුරුවක් (66%) දක්වන අතර, කිසිදු ආගමික අනුබද්ධතාවක් නොමැතිව හැදී වැඩුණු සහ අදටත් "අනාගමිකව" සිටින සිංගප්පූරු ජාතිකයින්ගේ එම නැඹුරුව අඩු අගයක් ගනී (52%).

සමීක්ෂණයට ඇතුළත් කර ඇති සෑම මිනුමකින්ම පාහේ, තමන් දෙවියන් වහන්සේ සහ/හෝ අදෘශ්‍යමාන ජීවීන් විශ්වාස කරන බව පවසන ආගමික අනුබද්ධතාවක් නොමැත්තවුන් (විශ්වාස කරන "අනාගමිකයන්") අනෙකුත් "අනාගමිකයන්ට" වඩා ආධ්‍යාත්මික සහ ආගමික සංකල්ප පිළිබඳ සබැඳියාවක් දැක්වීමට වැඩි නැඹුරුවක් දක්වති. නිදසුනක් ලෙස, "විශ්වාස කරන අනාගමිකයන්" අති බහුතරයක් (84%) කර්මය පවතින බව සිතන නමුත්, සිංගප්පූරුවේ අනෙකුත් "අනාගමිකයන්ගෙන්" කර්මය විශ්වාස කරන්නේ 36% ක් පමණි. දෙවියන් වහන්සේ සහ/හෝ අදෘශ්‍යමාන ජීවීන් විශ්වාස කරන ආගමික අනුබද්ධතාවක් නොමැති අය අවමංගල්‍යයක් සැලසුම් කිරීමේ දී මියගිය ඥාතියාගේ ආත්මය වෙනුවෙන් සිද්ධස්ථානවල චාරිත්‍ර ඉටු කිරීම වැදගත් බව පැවසීමට ඇති නැඹුරුව අනෙක් අයට වඩා බොහෝ සෙයින් වැඩි ය (63% එදිරිව 36%).

## ආගමික සහ ජාතික අනන්‍යතා සම්බන්ධ කරන්නන් අනෙක් අයගෙන් වෙනස් වන ආකාරය

සමහර ප්‍රාදේශීය විද්වතුන් නිරීක්ෂණය කර ඇති කරුණක් වන්නේ එක් එක් රටෙහි බහුතර ආගම කේන්ද්‍ර කොටගෙන ජාතිකවාදී ව්‍යාපාර සඳහා ලැබෙන සහයෝගය ඉහළ බව යි.[12]


ඉහත පැහැදිලි කළ පරිදි, එක් එක් රටෙහි ආගමික බහුතරයේ බොහෝ සාමාජිකයින් (කාම්බෝජය, ශ්‍රී ලංකාව සහ තායිලන්තයේ බෞද්ධයන් මෙන්ම ඉන්දුනීසියාවේ සහ මැලේසියාවේ මුස්ලිම්වරුන්) පවසන්නේ තම ජාතික අනන්‍යතාව සැබවින්ම බෙදා ගැනීමට තම ආගමික කණ්ඩායමේ සාමාජිකයෙකු වීම ඉතා වැදගත් බව යි. බොහෝ අය ඔවුන්ගේ ජන සමාජයේ නීති තම ආගමේ ඉගැන්වීම් මත පදනම් විය යුතු බව ද පවසති.

මේවායින් එක් මතයක් දරන පුද්ගලයින් විශේෂයෙන් අනෙක් මතය දැරීමේ නැඹුරුවක් පවතී. එමෙන්ම මත දෙකම ප්‍රකාශ කරන්නන් මෙම කොටසෙහි "**ආගම්-රාජ්‍ය අනුකලනවාදීන්**" ලෙස හඳුන්වා ඇත. (පුළුල් ලෙස ගත් විට, ආගම්-රාජ්‍ය අනුකලනය, එක්සත් ජනපදය තුළ හා අනෙකුත් සමහර රටවල නීත්‍යානුකූලව හෝ සාම්ප්‍රදායිකව අනුගමනය කරනු ලබන, ආගම ඇදහීමට බල කිරීම හෝ ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍යයේ බලය යොදා නොගත යුතු ය යන මූලධර්මය, එනම් "පල්ලිය සහ රාජ්‍යය වෙන් කිරීම" යන්නෙහි ප්‍රතිවිරුද්ධ අරුත ලෙස වටහා ගත හැක.)

[12] මයිකල් ඩී. බාර්. 2010. ".වාර්ගික ජාතිකවාදය මඟ පාදන ආගමික ජාතිවාදය :මැලේසියාවේ ඉස්ලාමීයකරණය" ජාත්‍යන්තර කටයුතු පිළිබඳ ඕස්ට්‍රේලියානු සඟරාව. Tonsakulrungruang, Khemthong. 2021 ද බලන්න තායිලන්තයේ බෞද්ධ ජාතිකවාදයේ පුනර්ජීවනය සහ ආගමික නිදහස" කෙරෙහි එහි අහිතකර බලපෑම". නීතිය සහ සමාජය පිළිබඳ ආසියානු සඟරාව කාම්බෝජයේ ජාතිකවාදයේ මෑත ඉතිහාසය පිළිබඳ තොරතුරු සඳහා පහත ප්‍රකාශන කියවන්න: චාල්ස් කීස්. 2016. "ථේරවාද බුද්ධාගම සහ බෞද්ධ ජාතිකවාදය: ශ්‍රී ලංකාව, මියන්මාරය, කාම්බෝජය සහ තායිලන්තය." ඇදහිල්ල සහ ජාත්‍යන්තර කටයුතු පිළිබඳ සමාලෝචනය.

## කාම්බෝජයේ බෞද්ධයන් සියලු දෙනාම පාහේ බෞද්ධ ධර්මය මත පදනම්ව තම නීතිය සකස් කර ගැනීමට සහයෝගය දක්වති

*පහත මත දරන්නන්ගේ%*




සටහන: කාම්බෝජය, ශ්‍රී ලංකාව, සහ තායිලන්තය තුළ ජාතික අනන්‍යතාව සඳහා යමෙකු බෞද්ධයෙකු වීමේ වැදගත්කම සහ බෞද්ධ ධර්මය මත නීතිය පදනම් කර ගැනීමේ වැදගත්කම පිළිබඳව ප්‍රතිචාර දැක්වූවන්ගෙන් විමසන ලදී. ඉන්දුනීසියාව සහ මැලේසියාව තුළ ජාතික අනන්‍යතාව සඳහා යමෙකු මුස්ලිම් ජාතිකයෙකු වීමේ වැදගත්කම සහ ෂරියා නීතිය රටේ නිල නීතිය බවට පත් කිරීමේ වැදගත්කම පිළිබඳව ප්‍රතිචාර දැක්වූවන්ගෙන් විමසන ලදී.
මූලාශ්‍රය: සමීක්ෂණය 2022 ජූනි මස 1 සිට සැප්තැම්බර් 4 දක්වා දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් හයක වැඩිහිටියන් අතර සිදු කරන ලදී. විස්තර සඳහා ක්‍රමවේදය කියවන්න.
"දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව"

**PEW RESEARCH CENTER**

ඉන්දුනීසියාවේ (57%) සහ මැලේසියාවේ (69%) මුස්ලිම්වරුන්ගෙන් බහුතරයක්, ශ්‍රී ලංකාවේ (72%) සහ කාම්බෝජයේ (75%) බෞද්ධයන් මෙන්ම ආගම්-රාජ්‍ය අනුකලනවාදීන් වේ. තායිලන්ත බෞද්ධයන්ගෙන් සැලකිය යුතු සුළුතරයක් (45%) ද මෙම කාණ්ඩය යටතට වැටේ.

## ‘ආගම්-රාජ්‍ය අනුකලනවාදීන්’ විශේෂයෙන් ම ආගමික වේ

ආගම්-රාජ්‍ය අනුකලනවාදීන් තම ආගමික ප්‍රජාවේ සිටින අනෙකුත් සාමාජිකයින්ගෙන් විවිධ ආකාරවලින් ඉස්මතු වී පෙනේ.


කලාපය සමස්තයක් වශයෙන් ඉතා ආගමික වන අතර, ආගම්-රාජ්‍ය සංකලනවාදීන් සාමාන්‍යයෙන් මිනුම් රාශියකින් අනෙකුත් මිනිසුන්ට වඩා *වැඩි* ආගමික බවකින් යුක්ත වේ.

නිදසුනක් ලෙස, කාම්බෝජ බෞද්ධයන් අතර සැබෑ කාම්බෝජ ජාතිකයෙකු වීමට බෞද්ධයෙකු වීම ඉතා වැදගත් බවත්, කාම්බෝජ නීතිය බෞද්ධ ධර්මය මත පදනම් විය යුතු බවත් යන දෙකම පවසන අය, තම ජීවිතයට ආගම ඉතා වැදගත් බව පැවසීමට ඇති නැඹුරුව අනෙකුත් බෞද්ධයන්ට වඩා වැඩි ය (72% එදිරිව 48%).


අවමංගල්‍ය කටයුතු සම්බන්ධ ආකල්ප ද, එවැනිම බෙදීමක් පෙන්නුම් කරයි. නිදසුනක් ලෙස, ඉන්දුනීසියාවේ මුස්ලිම් ප්‍රජාවේ ආගම්-රාජ්‍ය අනුකලනවාදීන්ගෙන් හතරෙන් තුනක් පමණ පවුලේ සාමාජිකයෙකුගේ අවමංගල්‍යයක් සැලසුම් කිරීමේ දී ඉමාම් හෝ ෂෙයික්වරයෙකුට ශුද්ධ ග්‍රන්ථ කියවීමට හෝ

### තම ජාතිය සහ ආගම දැඩිව සම්බන්ධ කරන්නන් ආගමික වීමට වැඩි නැඹුරුවක් පවතී

ආගම තම ජීවිතවලට ඉතා වැදගත් බව පවසන්නන්ගේ %




පවුලේ කෙනෙකුගේ හෝ ආදරණීයයෙකුගේ අවමංගල්‍යයක් සැලසුම් කිරීමේ දී ශුද්ධ පාඨ කියවීමට හෝ දේශනාවක් සිතු කිරීමට ආගමික නායකයෙකුට ආරාධනා කිරීම ඉතා වැදගත් බව පවසන්නන්ගේ %*




* බෞද්ධයන්ගෙන් “භික්ෂුවක් හෝ උගත් පුද්ගලයෙකු” ගැන විමසන ලදී. මුස්ලිම්වරුන්ගෙන් “ඉමාම් හෝ ෂෙයික්වරයෙකු” ගැන විමසන ලදී.

සටහන: සංඛ්‍යානමය වශයෙන් වැදගත් වෙනස්කම් තද පැහැයෙන් ඉස්මතු කර ඇත. වටැයීමට පෙර වෙනස්කම් ගණනය කර ඇත. "ආගම්-රාජ්‍ය අනුකලනවාදීන්" යනු ජාතික අනන්‍යතාව සැබෑ ලෙස බෙදා ගැනීමට තම ආගමික ප්‍රජාවේ සාමාජිකයෙකු වීම ඉතා වැදගත් බවත්, තම ජන සමාජයේ නීති තම ආගම මත පදනම් විය යුතු බවත් පවසන්නන් වේ.

මූලාශ්‍රය: සමීක්ෂණය 2022 ජුනි මස 1 සිට සැප්තැම්බර් 4 දක්වා දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් හයක වැඩිහිටියන් අතර සිදු කරන ලදී. විස්තර සඳහා ක්‍රමවේදය කියවන්න.

"දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව"

PEW RESEARCH CENTER

දේශනාවක් සිදු කිරීමට ආරාධනා කිරීම ඉතා වැදගත් බව පවසන අතර, මීට සාපේක්ෂව රටේ අනෙකුත් මුස්ලිම්වරුන්ගෙන් මෙසේ පවසන්නේ දළ වශයෙන් තුනෙන් දෙකක ප්‍රමාණයකි (77% එදිරිව 64%).


(සුළුතර ප්‍රජාවන් අතර ඇතුළුව, මෙම කලාපයේ සාමාන්‍ය ආගමික මට්ටම් පිළිබඳ වැඩි විස්තර සඳහා, ඉංග්‍රීසි බසින් ඇති 3 වැනි පරිච්ඡේදය සහ 4 වැනි පරිච්ඡේදය කියවන්න. අවමංගල්‍ය පිළිවෙත් පිළිබඳ වැඩි විස්තර සඳහා ඉංග්‍රීසි බසින් ඇති 5 වැනි පරිච්ඡේදය බලන්න.)

එසේම ආගම්-රාජ්‍ය අනුකලනවාදීන්:

- තම ආගමික නායකයන්ගේ දේශපාලනික මැදිහත්වීමට සහාය දැක්වීමට ඇති නැඹුරුව තම රටවල සිටින අනෙකුත් බෞද්ධයන් හෝ මුස්ලිම්වරුන්ට වඩා වැඩි ය
- සුළුතර ආගම්වල වැසියන් අසල්වැසියන් කොටගැනීමට කැමති වීමට ඇති නැඹුරුව අඩු ය
- සුළුතර ආගමික ප්‍රජාවන්ගෙන් තම ආගමට තර්ජන ඇතිවන බව දැකීමට ඇති නැඹුරුවටිකක් වැඩි ය.

පුද්ගලික ආගමිකත්වය, වයස, ස්ත්‍රී පුරුෂ භාවය සහ අධ්‍යාපනය වැනි අනෙකුත් සාධක සඳහා පාලනය කිරීමේ දී පවා මෙම සබඳතා සාමාන්‍යයෙන් පවතී. වෙනත් ආකාරයකින් කිවහොත්, **ආගම සහ රාජ්‍යය අතර සම්බන්ධය පිළිබඳ මතයන් සහ මෙම අනෙකුත් ප්‍රශ්න පිළිබඳ අදහස් අතර පවතින සහසම්බන්ධතා ආගම්-රාජ්‍ය අනුකලනවාදීන් වඩා ත් ආගමික බවින් යුතු වේ යන කාරණයට වඩා ඉහළින් සහ ඉන් ඔබ්බෙන් පවතී.** කාම්බෝජයේ ආගම්-රාජ්‍ය අනුකලනවාදීන් සමහර අවස්ථාවල දී සමීක්ෂණය කරන ලද අනෙකුත් රටවල් හතර පුරා දක්නට ලැබෙන ප්‍රවණතා සමග පරස්පර වේ.

# ආගම්-රාජ්‍ය අනුකලනවාදීන් ආගමික නායකයින් දේශපාලඥයින් වීමට සහාය දැක්වීමට ඇති නැඹුරුව අනෙක් අයට වඩා වැඩි ය.




සටහන: සංඛ්‍යානමය වශයෙන් වැදගත් වෙනස්කම් තද පැහැයෙන් ඉස්මතු කර ඇත. වටැයීමට පෙර වෙනස්කම් ගණනය කර ඇත. "ආගම්-රාජ්‍ය අනුකලනවාදීන්" යනු ජාතික අනන්‍යතාව සැබෑ ලෙස බෙදා ගැනීමට තම ආගමික ප්‍රජාවේ සාමාජිකයෙකු වීම ඉතා වැදගත් බවත්, තම ජන සමාජයේ නීති තම ආගම මත පදනම් විය යුතු බවත් පවසන්නන් වේ.

මූලාශ්‍රය: සමීක්ෂණය 2022 ජූනි මස 1 සිට සැප්තැම්බර් 4 දක්වා දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් හයක වැඩිහිටියන් අතර සිදු කරන ලදී. විස්තර සඳහා ක්‍රමවේදය කියවන්න.

"දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව"

PEW RESEARCH CENTER

## දේශපාලනය තුළ ආගම

යමෙකු අපේක්ෂා කළ හැකි පරිදි, ආගම්-රාජ්‍ය අනුකලනවාදීන් ආගමික නායකයින්ගේ සෘජු දේශපාලන මැදිහත් වීමට සහයෝගය දීමට ඇති නැඹුරුව තම ප්‍රජාවන්හි සිටින අනෙක් අයට වඩා තරමක් වැඩි ය.

නිදසුනක් ලෙස, තායිලන්තයේ බෞද්ධ සහ තායි අනන්‍යතා සම්බන්ධ කරන සහ තායි නීතිය බෞද්ධ ධර්මය මත පදනම් විය යුතු බව පවසන බෞද්ධයන්, ආගමික නායකයන් දේශපාලනඥයන් විය යුතු බව පැවසීමට අනෙක් බෞද්ධයන් දක්වන නැඹුරුවට මෙන් දළ වශයෙන් දෙගුණයක නැඹුරුවක් පෙන්නුම් කරයි (31% එදිරිව 16%).

කෙසේ නමුත්, බෞද්ධ ආගම්-රාජ්‍ය අනුකලනවාදීන් අතර පවා, අඩක් හෝ ඊට අඩු පිරිසක් ආගමික නායකයින් දේශපාලනඥයන් විය යුතු බවත්, ඔවුන් සහයෝගය දක්වන දේශපාලනඥයන් ගැන ප්‍රසිද්ධියේ කතා කළ යුතු බවත්, හෝ දේශපාලන විරෝධතාවලට සහභාගී විය යුතු බවත් පවසති. ඉන්දුනීසියාවේ සහ මැලේසියාවේ මුස්ලිම්වරු තම ආගමික නායකයින් දේශපාලන ක්ෂේත්‍රයට සම්බන්ධ වනු දැකීමට වැඩි කැමැත්තක් දක්වති.

තම ආගම ජාතික අනන්‍යතාව සමග දැඩි ලෙස සම්බන්ධ කරන බහුතර ආගමික ප්‍රජාවේ සාමාජිකයින්, තම රටට අගෞරව කිරීම යමෙකු තම ආගමේ සැබෑ කොටස්කරුවකු වීමට නුසුදුස්සෙකු බවට පත් කරන බව පැවසීමට ඇති නැඹුරුව අනෙක් අයට වඩා වැඩි ය. ශ්‍රී ලාංකික බෞද්ධයන් අතර ආගම්-රාජ්‍ය අනුකලනවාදීන් 73% ක් පවසන්නේ යම් පුද්ගලයෙක් ශ්‍රී ලංකාවට ගරු නොකරන්නේ නම් ඔවුන්ට සැබෑ බෞද්ධයින් විය නොහැකි බව වන අතර, ශ්‍රී ලංකාවට අගෞරව කිරීම යමෙකු බෞද්ධ වීමට නුසුදුසු බව පවසන අනෙකුත් ශ්‍රී ලාංකික බෞද්ධයින් ප්‍රමාණයට වඩා ඔවුන්ගේ ප්‍රමාණය සැලකිය යුතු වැඩි ය ( 62%).

(දේශපාලනය තුළ ආගමික නායකයින්ගේ භූමිකාව පිළිබඳ වැඩි විස්තර සඳහා ඉංග්‍රීසි බසින් ඇති 7 වැනි පරිච්ඡේදය කියවන්න. යමෙක් ආගමික ප්‍රජාවක කොටස්කරුවෙකු වීමට නුසුදුසු බවට පත් කරන ක්‍රියාකාරකම් මොනවා ද යන්න පිළිබඳ වැඩි විස්තර සඳහා ඉංග්‍රීසි බසින් ඇති 2 වැනි පරිච්ඡේදය බලන්න.)


## සුළුතර ආගම් කෙරෙහි දක්වන අදහස්

බෞද්ධ ජාතිකවාදය ශ්‍රී ලංකාවේ පැවති සිවිල් යුද්ධය ද ඇතුළුව ථේරවාදී බුද්ධාගමෙහි ආධිපත්‍යය සහිත රටවල බෞද්ධයන් සහ ආගමික සුළුතරයන් අතර පවතින එදිරිවාදිකම සහ ප්‍රචණ්ඩත්වය සමග සම්බන්ධ කොට දක්වයි. ඒ හා සමානව ම, මුස්ලිම් බහුතරයක් සිටින ඉන්දුනීසියාව තුළ නැඟී එන "ආගමික ජාතිකවාදය" සහ විජාතික භීතිකාව අතර සම්බන්ධයක් ඇති බව සමහර විද්වතුන් ප්‍රකාශ කොට ඇත.


පොදුවේ ගත් කල, ජාතික අනන්‍යතාව සැබෑ ලෙස බෙදාහදා ගැනීම සඳහා තම ආගමික ප්‍රජාවේ සාමාජිකයෙකු වීම ඉතා වැදගත් බව පවසන *සහ* තම ජන සමාජයේ නීති තම ආගම මත පදනම් විය යුතු බව පවසන පුද්ගලයින්, වෙනත් ආගම් තම රටේ සංස්කෘතිය හා සාරධර්ම සමග අනුකූල වන බව දැකීමට ඇති නැඹුරුව අඩු ය. ඔවුන් වෙනත් ආගම්වල අනුගාමිකයින් අසල්වැසියන් ලෙස පිළිගැනීමට ඇති නැඹුරුව අඩු නමුත් බොහෝ ආගම්-රාජ්‍ය අනුකලනවාදීන් පවසන්නේ ඔවුන් වෙනත් ආගම්වල මිනිසුන් අසල්වැසියන් ලෙස පිළිගැනීමට කැමති *වනු ඇති* බව යි.

### ආගම්-රාජ්‍ය අනුකලනවාදීන් කිතුනු අසල්වැසියන් පිළිගැනීමට අඩු කැමැත්තක් දක්වයි

ක්‍රිස්තියානි ධර්මය තම රටේ සංස්කෘතිය හා සාරධර්ම සමග අනුකූල වන බව පවසන %




කිතුනුවන් අසල්වැසියන් ලෙස පිළිගැනීමට තමන් කැමති බව පවසන %




සටහන: සංඛ්‍යානමය වශයෙන් වැදගත් වෙනස්කම් තද පැහැයෙන් ඉස්මතු කර ඇත. වටැයීමට පෙර වෙනස්කම් ගණනය කර ඇත. "ආගම්-රාජ්‍ය අනුකලනවාදීන්" යනු ජාතික අනන්‍යතාව සැබෑ ලෙස බෙදා ගැනීමට තම ආගමික ප්‍රජාවේ සාමාජිකයෙකු වීම ඉතා වැදගත් බවත්, තම ජන සමාජයේ නීති තම ආගම මත පදනම් විය යුතු බවත් පවසන්නන් වේ.
මූලාශ්‍රය: සමීක්ෂණය 2022 ජුනි මස 1 සිට සැප්තැම්බර් 4 දක්වා දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් හයක වැඩිහිටියන් අතර සිදු කරන ලදී. විස්තර සඳහා ක්‍රමවේදය කියවන්න.
"දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව"

**PEW RESEARCH CENTER**

නිදසුනක් ලෙස, ඉන්දුනීසියානු මුස්ලිම්වරුන්ගෙන් ක්‍රිස්තියානි ධර්මය ඉන්දුනීසියානු සංස්කෘතියට සහ සාරධර්මවලට (53% එදිරිව 63%) අනුකූල බව පැවසීමට හෝ කිතුනුවන් අසල්වැසියන් ලෙස පිළිගන්නා බව පැවසීමට (64% එදිරිව 77%) නැඹුරු ආගම්-රාජ්‍ය සංකලනවාදීන් ප්‍රමාණය වෙනත් මුස්ලිම්වරුන්ට වඩා අඩු ය. හින්දු සහ චීන සාම්ප්‍රදායික ආගම් අනුගාමිකයින් වැනි අනෙකුත් ආගමික ප්‍රජාවන් පිළිබඳ විමසීමේ දී මෙම රටාව පුළුල් ලෙස දක්නට ලැබේ.

කෙසේ නමුත්, මෙහි දී කාම්බෝජ බෞද්ධයන් කැපී පෙනේ. කාම්බෝජයේ සංස්කෘතිය සහ සාරධර්මවලට වෙනත් ආගම්වල ගැලපීම අසල්වැසි ආගමිකයන් පිළිබඳ විමසන ලද කිසිදු ප්‍රශ්නයක් සම්බන්ධයෙන් කාම්බෝජයේ ආගමික-රාජ්‍ය සංකලනවාදීන් සහ අනෙකුත් බෞද්ධයන් අතර සැලකිය යුතු වෙනස්කම් දක්නට නොලැබේ.

(සමීක්ෂණය කරන ලද රටවල් පුරා අනෙකුත් ආගමික කණ්ඩායම් කෙරෙහි දක්වන ආකල්ප පිළිබඳ වැඩි විස්තර සඳහා ඉංග්‍රීසි බසින් ඇති 6 වැනි පරිච්ඡේදය කියවන්න.)

# ආගම්-රාජ්‍ය අනුකලනවාදීන් සුළුතර ආගමික ජනගහන වර්ධනය තර්ජනයක් ලෙස දැකීමට ඇති ඉඩකඩ ඉහළ ය




සටහන: බුදුදහමට ඇති තර්ජන පිළිබඳ බෞද්ධයන්ගෙන් විමසන ලද අතර; ඉස්ලාම් ආගමට ඇති තර්ජන පිළිබඳ මුස්ලිම්වරුන්ගෙන් විමසන ලදී. සංඛ්‍යානමය වශයෙන් වැදගත් වෙනස්කම් තද පැහැයෙන් ඉස්මතු කර ඇත. වටැයීමට පෙර වෙනස්කම් ගණනය කර ඇත. "ආගම්-රාජ්‍ය අනුකලනවාදීන්" යනු ජාතික අනන්‍යතාව සැබෑ ලෙස බෙදා ගැනීමට තම ආගමික ප්‍රජාවේ සාමාජිකයෙකු වීම ඉතා වැදගත් බවත්, තම ජන සමාජයේ නීති තම ආගම මත පදනම් විය යුතු බවත් පවසන්නන් වේ.

මූලාශ්‍රය: සමීක්ෂණය 2022 ජූනි මස 1 සිට සැප්තැම්බර් 4 දක්වා දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් හයක වැඩිහිටියන් අතර සිදු කරන ලදී. විස්තර සඳහා ක්‍රමවේදය කියවන්න.
"දකුණු සහ අග්නිදිග ආසියාවේ බුද්ධාගම, ඉස්ලාම් ධර්මය සහ ආගමික බහුවිධතාව"

**PEW RESEARCH CENTER**

ආගම සහ ජාතික අනන්‍යතාව සම්බන්ධ කරන සහ තම ජාතික නීති පද්ධතිය ආගම මත පදනම් විය යුතු බව පවසන්නන්, විවිධ ආගමික සුළුතරයන්ගේ ජනගහනය ඉහළ යාම තම රටේ බුද්ධාගමට හෝ ඉස්ලාමයට තර්ජනයක් බව පැවසීමට ඇති නැඹුරුව තරමක් ඉහළ ය.

නිදසුනක් ලෙස, තායිලන්ත බෞද්ධයින්ගෙන් දහයෙන් තුනක් වන ආගම්-රාජ්‍ය අනුකලනවාදීන් පවසන්නේ තායිලන්තයේ කිතුනුවන්ගේ වැඩිවීම තායිලන්ත බුද්ධාගමට තර්ජනයක් බව වන අතර, ඒ මෙම මතය ප්‍රකාශ කරන අනෙකුත් තායිලන්ත බෞද්ධයන්ගෙන් 21% කට වැඩි ප්‍රමාණයකි.

(මෙම ප්‍රශ්න සැලසුම් කරනු ලැබුවේ සමීක්ෂණය කරන ලද රටවල් තුළ මෙම සුළුතර ජනගහනය සත්‍ය වශයෙන්ම වර්ධනය වන්නේ ද නොවේ ද යන්න නොසලකා, ජනවිකාස උත්සුකයන් මැන බැලීම සඳහා වේ.)

පොදුවේ ගත් කල, ආගම්-රාජ්‍ය අනුකලනවාදීන් වෙනත් රටවලින් පැමිණෙන සංචාරකයින් සහ චීනයේ බලපෑම තම රටේ බුද්ධාගමට සහ ඉස්ලාමයට තර්ජනයක් බව පැවසීමට ඇති නැඹුරුව වෙනත් බෞද්ධයන්ට හෝ මුස්ලිම්වරුන්ට වඩා තරමක් වැඩි ය. කෙසේ නමුත්, ඔවුන් තමාගේම ප්‍රජාවේ සිටින අන්තවාදීන් තම රටේ බුද්ධාගමට හෝ ඉස්ලාමයට තර්ජනයක් ලෙස දැකීමට එවැනිම නැඹුරුවක් පවතී. නිදසුනක් ලෙස, ශ්‍රී ලංකාවේ බෞද්ධයන්ගෙන් ආගම්-රාජ්‍ය අනුකලනවාදීන් සහ ඇනෙකුත් බෞද්ධයින් යන දෙපාර්ශ්වයෙන්ම හතරෙන් තුනක් පමණ (පිළිවෙලින් 73% සහ 75%) පවසන්නේ බෞද්ධ අන්තවාදීන් ශ්‍රී ලංකාවේ බුද්ධාගමට තර්ජනයක් බව යි

ඒ හා සමානව ම, එක්සත් ජනපදයේ බලපෑම තර්ජනයක් දැයි විමසූ විට රටක් තුළ සිටින කණ්ඩායම් දරන්නේ පොදුවේ එකිනෙකට සමාන මතයකි.

අනෙකුත් මාතෘකා සම්බන්ධයෙන් ද ආගම්-රාජ්‍ය අනුකලනවාදීන් ලෙස වර්ගීකරණය කරන හෝ නොකරන බෞද්ධයන් අතර කාම්බෝජයේ බුද්ධාගමට ඇතැයි සිතන තර්ජන පිළිබඳ පවතින මතයෙහි සැලකිය යුතු වෙනස්කම් නොමැත. (බුද්ධාගමට සහ ඉස්ලාම් ආගමට ඇතැයි සිතන තර්ජන සම්බන්ධයෙන් දරන ආකල්ප පිළිබඳ වැඩි විස්තර සඳහා ඉංග්‍රීසි බසින් ඇති 6 වැනි පරිච්ඡේදය බලන්න.)

*මෙම සමීක්ෂණයේ සොයාගැනීම් පිළිබඳ සාරාංශය එහි මුල් ඉංග්‍රීසි අනුවාදයෙන් සිංහල භාෂාවට පරිවර්තනය කර ඇත.*